Indrani

# පුස්තකාල ප්‍රවෘත්ති

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ ප්‍රවෘත්ති ප්‍රකාශනය

8 වන කලාපය 3/4 1987 ජූලි—දෙසැම්බර්

පටුන

| | |
|---|---|
| කතුවැකිය | 1—3 |
| දෘශ්‍ය දත්ත ප්‍රකාශන සහ දත්ත බැංකු | 4—7 |
| සිතියම් එකතුන් හා මහජන පුස්තකාල | 8—11 |
| දරුවාට පොතක් තෝරා දීම | 12—13 |
| SLNLSB and the Public Library Services in Sri Lanka | 14—17 |
| දේශීය පුස්තකාල හා විඥාපන විද්‍යා පාඨමාලා සහතික පත්‍ර | 19 |
| ජාතික පුස්තකාලය, සම්ප්‍රදාය හා වෙනස | 20—22 |
| පුවත් ලුහුඬින් | 23—24 |
| මහජන පුස්තකාල ව්‍යවස්ථා කමිටු නිර්දේශ | 27 |

## ජාතික විද්‍යා හා තාක්ෂණ විඥාපන ප්‍රතිපත්තිය

ජාතික විද්‍යා හා තාක්ෂණ විඥාපන ප්‍රතිපත්තියක් සකස් කිරීම සඳහා ස්වාභාවික සම්පත් බලශක්ති හා විද්‍යා අධිකාරිය ප්‍රයත්න දැරීම පැසසිය යුතු කරුණකි. විද්‍යාව හා තාක්ෂණය ලංකාව වැනි තුන්වන ලෝකයේ රටවල සංවර්ධනය සඳහා ඇති ප්‍රධානම ආධාරක බව පිළිගත් කරුණකි. සංවර්ධනය වූ රටවල් සහ සංවර්ධනය වෙමින් පවත්නා රටවල් අතර ඇති පරතරය ප්‍රධාන වශයෙන් විද්‍යා හා තාක්ෂණ අංශයේ ඇති පරතරය වේ. මේ හේතුවෙන් විද්‍යා තාක්ෂණ අංශ සංවර්ධනය කරලීම අද සංවර්ධනය වන රටවල ප්‍රධාන සංවර්ධන උපාය මාර්ගය වී ඇත.

මෙම අංශ වර්ධනය කරලීම පැහැදිලි ජාතික ප්‍රතිපත්තියක් මත ඉටු කළ යුතු භාරදූර වගකීමක් වේ. සැලැස්මකින් තොර වෙනත් ඕනෑම කාර්යයක් මෙන් සැලසුම් රහිතව කෙරෙන විද්‍යා හා තාක්ෂණික සංවර්ධනයද අවසානයේදී ජාතික ධනය අපතේ යවන අසාර්ථක ප්‍රයත්නයක් වනු ඇත.

විද්‍යා හා තාක්ෂණ විඥාපන සේවාවක් සැලසුම් කිරීම පිළිබඳ අවධානය යොමු කරන විට එහි මූලික පදනම විය යුත්තේ එය පුළුල් ජාතික විද්‍යා හා තාක්ෂණික සැලසුමක අංශයක් ලෙස සැලකීම වේ. මෙහි දී දේශීය වශයෙන් කැපී පෙනෙන මූලික අඩුපාඩුව නම් ජාතික විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්තියක් තවමත් පැහැදිලිව ඉදිරිපත් නොවීමයි. මූලික අධ්‍යයන ආයතනය, ස්වාභාවික සම්පත් බලශක්ති හා විද්‍යා අධිකාරිය සහ දිවයිනේ ප්‍රධාන සරසවිවල විද්‍යාඥයින්ගෙන් සමන්විත වුණු කමිටුවක් දැනට වසර කිහිපයකට පෙර

# මහජන පුස්තකාල පනතකට මං කැපේ.

ලංකාවේ පළාත් පාලන පුස්තකාල සේවාව වැඩි දියුණු කිරීම සඳහා සුදුසු ව්‍යවස්ථාමය පදනමක් ඇති කිරීම පිළිබඳව සොයා බලා නිර්දේශ කිරීමට පුස්තකාල සේවා මණ්ඩලයේ සභාපතිවරයා විසින් පත් කරන ලද මහජන පුස්තකාල ව්‍යවස්ථා උපදේශක කමිටුවේ වාර්තාව දැන් ඉදිරිපත් කොට ඇත.

1986 අප්‍රේල් මාසයේ පත් කරන ලද මෙම කමිටුව 1987 මැද භාගය දක්වා රැස්වීම් ගණනාවක් පවත්වා කරුණු සලකා බැලීමෙන් පසු මේ වාර්තාව සකස් කර ඇත.

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය පළාත් පාලන දෙපාර්තමේන්තුව, පළාත් පාලන සේවා දෙපාර්තමේන්තුව, නීති කෙටුම්පත් සම්පාදන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා පුස්තකාල සංගමය යන ආයතනවල නියෝජිතවරුද, කොළඹ හා මහනුවර මහජන පුස්තකාලවල පුස්තකාලයාධිපතිවරුද මේ කමිටුවට ඇතුළත් වූහ. ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා මෙහි ලේකම්වරයා වශයෙන් ක්‍රියා කළේය.

මහජන පුස්තකාල ව්‍යවස්ථා පිළිබඳ සම්මන්ත්‍රණයක් පවත්වා කමිටුව සිය කාර්යයන් ආරම්භ කළ අතර, මහජන පුස්තකාල ව්‍යවස්ථාවක ඇතුළත් විය යුතු මූලික කරුණු එහිදී සාකච්ඡා කරන ලදී. ලංකාවේ සියලුම ජ්‍යෙෂ්ඨ පුස්තකාලයාධිපතීහු මේ සම්මන්ත්‍රණයට සහභාගි වූහ.

කමිටුව මගින් ඉදිරිපත් කරන ලද වාර්තා කෙටුම්පත මහජන පුස්තකාල උපදේශක කමිටුව විසින් අනුමත කර ඇති අතර, එය ගරු අධ්‍යාපන සේවා ඇමතිතුමා මගින් ගරු අගමැතිතුමා වෙත ඉදිරිපත් කරනු ඇත.

මේ වාර්තාවේ සඳහන් යෝජනා අනුසාරයෙන්, පළාත් පාලන අමාත්‍යාංශය විසින් මහජන පුස්තකාල පනතක් ඉදිරිපත් කරනු ඇතැයි අපේක්ෂා කැරේ.

## ජාතික පුස්තකාලයට ව්‍යවස්ථාමය පදනමක්

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයට අවශ්‍ය ව්‍යවස්ථාමය පදනම සකස් කරලීම සඳහා ජාතික පුස්තකාල පනතක් සකස් කරලීමට තමන් ඉක්මනින් පියවර ගන්නා බව අධ්‍යාපන සේවා අමාත්‍යාංශයේ ලේකම් එම්. බී. සී. සිල්වා මහතා ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ සුභසාධක සංගමයේ වාර්ෂික මහා සභා රැස්වීමේ දී ප්‍රකාශ කළේය.

1987. 09. 18 වන දින පැවති මේ රැස්වීම මණ්ඩලීය සේවයෙන් විශ්‍රාම ගිය සහකාර අධ්‍යක්ෂිකා කේ. එල්. පණ්ඩිතරත්න මහත්මිය, මණ්ඩලීය සේවයෙන් මාරුවී ගිය සහකාර අධ්‍යක්ෂ ධනපාල ගුණසේකර මහතා සහ පුස්තකාලයාධිපති ජී. එම්. පුංචිබණ්ඩා මහතා යන අයට සුභ පැතීම සඳහා ද සංවිධානය කරන ලදී.

මෙහිදී මුලසුනෝ දෙසුම කළ අධ්‍යාපන සේවා අමාත්‍යාංශයේ ලේකම්වරයා දැනට ජාතික පුස්තකාල ගොඩනැගිල්ලේ වැඩ කටයුතු අවසාන නිසා ඒ තුළ ශක්තිමත් සහ සාර්ථක ජාතික පුස්තකාලයක් ගොඩනැගීමට විධිමත් වැඩ පිළිවෙළක් ගෙන යා යුතු බව පළ කළේය. මෙබඳු කාර්යයකදී නීතිමය සහ ව්‍යවස්ථාමය පදනමක ඇති වැදගත්කම අවධාරණය කළ ලේකම්වරයා ලෝකයේ සෑම ශක්තිමත් ජාතික පුස්තකාලයකට ම, ශක්තිමත් ව්‍යවස්ථාමය පදනමක් ඇති බව සඳහන් කළේය. 1970 අංක 17 දරන ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩල පනතින් ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය සඳහා අවශ්‍ය පුළුල් ව්‍යවස්ථාමය පදනමක් සැපයී නොමැති නිසා එම අඩුපාඩුව ඉක්මනින් පියවීමට කටයුතු කිරීම අවශ්‍ය බව එතුමා සඳහන් කළේය. මෙහි මුල් පියවරක් වශයෙන් තමා ගරු අධ්‍යාපන සේවා ඇමතිතුමා හා ගරු අධ්‍යාපන ඇමතිතුමා සහ පුස්තකාල සේවා මණ්ඩලයේ සාමාජිකයින් සමග සාකච්ඡා කොට සුදුසු ජාතික පුස්තකාල ව්‍යවස්ථාවක් නිර්දේශ කරලීම සඳහා කමිටුවක් පත් කිරීමට අදහස් කරන බව සිල්වා මහතා සඳහන් කළේය.

පුස්තකාල සේවා මණ්ඩලයේ සභාපති එස්. අතුකෝරාළ, අධ්‍යක්ෂ එන්. අමරසිංහ, ධනපාල ගුණසේකර, ජී. එම්. පුංචිබණ්ඩා, එච්. එම්. ගුණරත්න බණ්ඩා සහ සේවක සුභසාධක සංගමයේ සභාපති නියෝජ්‍ය අධ්‍යක්ෂ එම්. එස්. යූ. අමරසිරි යන මහත්වරුද කේ. එල්. පණ්ඩිතරත්න මහත්මියද මෙහිදී කතා කළහ.

ජාතික විද්‍යා ප්‍රතිපත්තියක් සකස් කරලීමේ ප්‍රයත්නයක් දුරුවද තවමත් එය සාර්ථක අවසානයක් වෙත ළඟා වී නොමැත. 1978 වසරේදී ජාතික විද්‍යා ප්‍රතිපත්තිය පිළිබඳ සඳහන් කළ ගරු ජනාධිපතිතුමා විසින් එබඳු ප්‍රතිපත්තියක් පදනම් විය යුතු ප්‍රධාන අංශ හයක් ගැන සඳහන් කරන ලදී. ගරු ජනාධිපතිතුමාගේ එම දේශනය ජාතික විද්‍යා ප්‍රතිපත්තියක මුල් අඩිතාලම ලෙස සැලකිය හැක.

ජාතික විද්‍යා හා තාක්ෂණ විඥාපන ප්‍රතිපත්තිය, ජාතික විද්‍යා ප්‍රතිපත්තියට වඩා සාර්ථක අවසානයකට ළඟා වේ යැයි අප කාගේත් පැතුමයි. විඥාපන හා තොරතුරු සේවාවන් විද්‍යා හා තාක්ෂණ වර්ධනයේ අතිශය වැදගත් කාර්ය භාරයක් උසුලන බැවින් මෙම යෝජිත ප්‍රතිපත්තිය ඉතාමත් පරීක්ෂාවෙන් සකස් කළ යුතුවේ.

ඕනෑම රටක විද්‍යා හා තාක්ෂණ විඥාපන ප්‍රතිපත්තියක් සැකසීමේ දී ප්‍රධාන අංශ කිහිපයක් පිළිබඳ ව සැලකිලිමත් විය යුතුය. මින් පළමුවැන්න අදාල ප්‍රතිපත්තිය හොඳින් ක්‍රියාත්මක වීම සඳහා අවශ්‍ය මූලික ආයතනික හා සංවිධානාත්මක ව්‍යුහය සංවර්ධනය පිළිබඳ අවධානය යොමු කිරීම වේ. මේ යටතේ ප්‍රධාන විඥාපන හා ප්‍රලේඛන ආයතනය වන ජාතික පුස්තකාලය, විද්‍යා හා තාක්ෂණ තොරතුරු මධ්‍යස්ථානය, ජාතික ලේඛනාගාරය, ප්‍රධාන විද්‍යා හා තාක්ෂණික පුස්තකාල, විද්‍යා හා තාක්ෂණික පුස්තකාල ජාල වැනි ආයතන හා සංවිධාන ශක්තිමත් කරලීම පිළිබඳව මූලික අවධානය යොමුවීම වැදගත් වේ. එසේම මෙහි දී පුස්තකාලයාධිපතීන් හා විඥාපන විද්‍යාඥයින්ගේ වෘත්තීමය තත්ත්වයන් වැඩි දියුණු කිරීම පිළිබඳවද විශේෂ අවධානයක් යොමු කළ යුතු වේ.

ජාතික විද්‍යා හා තාක්ෂණ විඥාපන ප්‍රතිපත්තියක් සැකසීමේ දී අවධානය යොමු කළ යුතු තවත් ප්‍රධාන අංශයක් නම් ජාතික විඥාපන සේවාවන් වල වර්ධනය පිළිබඳ විශේෂ සැලකිල්ල යොමු කිරීමයි. මේ යටතේ දේශීය වශයෙන් ජනනය වන විද්‍යා හා තාක්ෂණ තොරතුරු හොඳින් පාලනය කිරීමේ හැකියාව ලබා දීම වැදගත් වේ. එසේම මෙම ක්ෂේත්‍රයේ පුස්තකාල, ප්‍රලේඛන මධ්‍යස්ථාන සහ දත්ත බැංකු වැනි දෑ සඳහා අවශ්‍ය පහසුකම් සැලැස්වීම අත්‍යවශ්‍ය වේ. විද්‍යා තාක්ෂණ ක්ෂේත්‍රයේ ඉතාමත් වැදගත් පුස්තකාල ද්‍රව්‍ය ලෙස සැලකෙන වාර සඟරා සඳහා වැය කෙරෙන මුදල් ප්‍රමාණය ලංකාවේ සෑම ප්‍රධාන පුස්තකාලයකම පාහේ පසුගිය දශක දෙක තුළ සීඝ්‍ර අඩුවීමක් පෙන්නුම් කරයි. අනෙක් පුස්තකාල ද්‍රව්‍ය පිළිබඳ තත්වයන් ද මෙයට සමාන වේ. ජාතික සැලැස්මක් යටතේ මෙම තත්ත්වයන් ඉක්මණින් මඟ හරවා ගැනීම අත්‍යවශ්‍ය කාර්යයක් වී ඇත. දේශීය දත්ත බැංකු ඇති කරලීම මෙන්ම අන්තර් ජාතික දත්ත බැංකු සමඟ සබඳතා ඇති කර ගැනීමද මෙම ක්ෂේත්‍රයේ ඇති මූලික අවශ්‍යතාවයක් වී ඇත. නව තාක්ෂණය, ලබා ගැනීමට පහසුකම් සැලැස්වීම ජාතික විඥාපන සැලැස්මකින් බලාපොරොත්තු වන තවත් විශේෂ සේවාවකි. මෙම නව තාක්ෂණ පහසුකම් යටතේ නව තාක්ෂණික මෙවලම් පරිහරණය පිළිබඳ මඟ පෙන්වීම සහ පහසුකම් සැලසීම, පරිගණක යන්ත්‍ර සහ ඒවායේ මෘදු භාණ්ඩ වල සුලභතාවය ඇති කරලීම, විදුලි සංදේශණය පහසුකම් සංවර්ධනය කරලීම වැනි අංශ කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ. විඥාපන ක්ෂේත්‍රයේ මිනිස් බල සම්පත් වර්ධනය ජාතික සැලැස්මක දී ප්‍රමුඛතාවය දිය යුතු තවත් අංශයකි. නව විඥාපන තාක්ෂණ විද්‍යාවනට ගැලපෙන ආකාරයට අධ්‍යාපන සහ පුහුණු පාඨමාලා ඇති කරලීම, පුහුණු කරවන්නන් පුහුණු කරලීමේ පාඨමාලා සංවිධානය, පාඨක පුහුණු පාඨමාලා ඇති කරලීම, විෂය විශේෂඥයින් සඳහා පාඨමාලා ඇති කරලීම මේ අංශයේ මූලිකත්වය දිය යුතු දේවල් වේ.

ඕනෑම ජාතික සැලැස්මක් සාර්ථක වීමට නම් එය ජාතික වශයෙන් මෙන්ම අන්තර් ජාතික වශයෙන් ද අදල ක්ෂේත්‍රයේ පිළිගත් ව්‍යුහයට සම්බන්ධ විය යුතුය. මේ අනුව අපගේ විද්‍යා හා තාක්ෂණ විඥාපන ප්‍රතිපත්තිය මේ අංශයේ ජාත්‍යන්තර ව පිළිගත් ප්‍රතිපත්තීන්වන යුනෙස්කෝ ආයතනයේ වැඩ සටහන් වලට සම්බන්ධ විය යුතුය. යුනෙස්කෝ ආයතනය 1974 වර්ෂයේ හඳුන්වා දුන් ජාතික විඥාපන සේවා (NATIS) සහ පසුව හඳුන්වා දුන් "ලෝක විද්‍යා විඥාපන පද්ධති වැඩ සටහන" (UNISIST) සහ මේ පද්ධතීන් දෙකම එකට සම්බන්ධ කොට 1976 වසරේ හඳුන්වා දුන් පොදු විඥාපන වැඩ සටහන (GIP) මේ අංශයේ පිළිගත් අන්තර් ජාතික ව්‍යාපෘති වේ. එම වැඩ සටහන් වලින් විශේෂයෙන්ම තුන්වන ලෝකයේ රටවල විඥාපන සැලසුම් සහ ප්‍රතිපත්තීන් ඇති කරලීම පිළිබඳ ව විස්තරාත්මක මඟ පෙන්වීම් කර ඇත. එම මඟ පෙන්වීම් වලින් ප්‍රයෝජන ගැනීම දේශීය සැලසුම් සකස් කරන්නන්ගේ වගකීම වේ.

ජාතික විද්‍යා හා තාක්ෂණික විඥාපන ප්‍රතිපත්තියක් සැකසීම ජාතික සංවර්ධනයේ නව සන්ධිස්ථානයක් සලකුණු කරයි. එය සර්වප්‍රකාරයෙන්ම සාර්ථක වේවායි යන්න අප සැමගේ පැතුමයි.


පුස්තකාල ප්‍රවෘත්ති

නොවරදවා ලබා ගැනීමට නම්

දායක වන්න.

# ද්‍රව්‍ය දත්ත ප්‍රකාශන සහ

## ධනපාල ගුණසේකර

**අධ්‍යක්ෂ, පුස්තකාල හා ප්‍රලේඛන සේවා ජාතික අධ්‍යාපන ආයතනය**

මම 1985 අගෝස්තු මාසයේදී ලන්ඩන් නුවර පැවැත්වූ අන්තර් ජාතික පරිගණක ප්‍රදර්ශනයක් නැරඹීමට ගියෙමි. විවිධ වර්ග වලට අයත් පරිගණක පද්ධති හා පරිගණකවලට සවි කරන උපකරණ වර්ග විශාල සංඛ්‍යාවක් එම ප්‍රදර්ශනයට ඉදිරිපත් කර තිබුණි. මෙම උපකරණ ප්‍රදර්ශනය කළ විවිධ වෙළඳ සමාගම් හා ආයතන විසින් එම භාණ්ඩ පිළිබඳ තොරතුරු ඇතුළත් පත්‍රිකා නරඹන්නන් අතර බෙදාහරිනු ලැබීය. පරිගණක ක්ෂේත්‍රයේ නව නිපැයුම් පිළිබඳව නොතිත් ආශාවකින් පෙළුණු මම ඒ හැම පත්‍රිකාවකින්ම පිටපතක් බැගින් එකතු කර ගතිමි. අවසාන ප්‍රදර්ශන කුටියෙන් පිටවෙන විට සෑහෙන බරැති මුද්‍රිත පත්‍රිකා තොගයක් මා සතුව තිබිණි.

ප්‍රදර්ශනය නරඹා පෙරළා නවාතැන් පොළට පැමිණි විගස මා කළේ මවිසින් රැස්කරගන්නා ලද පත්‍රිකා තොගය කිරා බැලීමයි. පත්‍රිකා තොගයේ බර කි. ග්‍රෑ. 7.5 ක් විය. පත්‍රිකාවේ නිමාවත් අලංකාරයත් උදෙසා ඇතුලත් කර තිබූ හිස් පිටු බැහැර කළ විට දළ වශයෙන් මුද්‍රිත පිටු 1500 ක් පමණ එහි විය. මෙම පිටුවල ඇතුළත් කර තිබුණු තොරතුරු සංඛ්‍යාමය දත්ත (**Digital Data**) මිනුම් ක්‍රමය අනුව සලකා බැලුවහොත් දළ වශයෙන් බයිට් 67,50,000 ක් වෙයි. එනම් කිලෝ බයිට් 6592 ක් හෙවත් මෙග බයිට් 6.6 කි.

මගේ ඊළග ප්‍රශ්නය වූයේ මෙම තොරතුරු පත්‍රිකා සම්භාරයෙන් මට අවශ්‍ය යම් නියත තොරතුරක් විගසින් ලබා ගන්නේ කෙසේද යන්නයි. මෙම පත්‍රිකා තොගය කුමන ක්‍රමයකට ගොනු කර තැබුවත් අවශ්‍ය යම් තොරතුරක් සොයා ගැනීමට මට ඇතැම් විට පත්‍රිකා සියල්ලම එකිනෙක පරීක්ෂා කිරීමට සිදුවේ. පත්‍රිකා එක් වරකට ගොනු කළ හැක්කේ එක් අනුපිළිවෙළකට පමණක් වන හෙයිනි.

පුස්තකාලයාධිපතින් කරන අන්දමට මෙම පත්‍රිකා තොගය සඳහා විස්තරාත්මක සූචියක් සම්පාදනය කිරීමද එතරම් ප්‍රයෝජනවත් කාරියක් නොවේ. ඊට හේතුව නම් මෙම පත්‍රිකා හුදු තාවකාලික අගයකින් පමණක් යුක්ත ඒවා නිසාය. ඒ නිසා අවශ්‍ය තොරතුරු ලබා ගත් පසුව මෙම පත්‍රිකා ගොඩගසා ගෙන සිටීමෙන් ඇති ඵලය කුමක්ද? එහෙයින් ඒවා සියල්ල කුණු කුඩයට දැමිය යුතුය. එමගින් මා කරන්නේ මගේ කසළ භාජනය ඉවත් කරන සේවකයා හා නගර සභාවේ කසළ ශෝධක සේවකයින් විසින් ඉවත් කළ යුතුව ඇති කසළ ගොඩට තවත් කසළ කිලෝ ග්‍රෑම් 7.6 ක බරක් එකතු කිරීමයි. එපමණක් ද නොවේ. මගේ ක්‍රියාව නිසා එකතුවූ එම අතිරේක කසළ ඉවත ලන ස්ථානයට ප්‍රවාහනය කිරීමත්, දවාලීමට හෝ වෙනත් ද්‍රව්‍යයකට පරිවර්තනය කිරීමටත් සැලකිය යුතු ඉන්ධන ප්‍රමාණයක් වැය කිරීමට නගර සභාවට සිදුවනු ඇත.

එම කඩදාසි තොගය දවා ලීම හේතුවෙන් දුම් වශයෙන් පරිසරයට එකතුවන අපද්‍රව්‍ය තොගයට ජීවයට හානිකර ද්‍රව්‍ය රැසක් ද අන්තර්ගත වේ. මෙම පත්‍රිකා මුද්‍රණය කිරීම සඳහා යොදාගත් මුද්‍රණ තීන්ත සහ කඩදාසි ඔප දමන ද්‍රව්‍ය පිළිස්සීමෙන් ක්ලෝරීන් ගෙන්දගම් වැනි රසායන ද්‍රව්‍ය වායුවට එක්වෙයි. ඒවා වාතයේ ඇති ජල අංශු හා ප්‍රතික්‍රියා කොට සල්පියුරික් අම්ලය වැනි ( $H_2SO_4$ ) ජීවයට හානිකර අම්ල බිහිවී වර්ෂාව මගින් යළි අප මතටම පතිත වෙයි.

## දත්ත බැංකු

මේ සියල්ලම අමතක කළත් එම කඩදාසි තොගය නිෂ්පාදනය කිරීමටත්, මුද්‍රණය කිරීමටත් වැය කරන ලද මිනිස් ශ්‍රමය හා ඉන්ධන පිළිබඳව නම් මට අමතක කළ නො හැකිය. අප කෙතරම් කාර්මික අතින් දියුණු වී සිටියද මෙම තොරතුරු පත්‍රිකාවක් නිපදවීම සඳහා මිනිස් ශ්‍රම පැය කිහිපයක් ගත වීම වැළැක්විය නොහැකිය. පත්‍රිකාව නිපදවීම සඳහා කඩදාසි නිෂ්පාදනය, තීන්ත නිෂ්පාදනය, රසායන ද්‍රව්‍ය නිෂ්පාදනය, අමුද්‍රව්‍ය නිෂ්පාදනය, මුද්‍රණය, ප්‍රවාහනය වැනි කාර්යයන් සිය ගණනක් ඉටුකළ යුතු වන හෙයින්, මෙතරම් ශ්‍රම ශක්තියක් හා කාලයක් වැය කොට නිපදවන ලද මුද්‍රණපත්‍රිකාවක් ප්‍රයෝජනයක් නොගෙන කසළ කුඩයට දැමීමෙන් මා කරන්නේ විශාල ශ්‍රම ශක්තියක් අපතේ යැවීමක් නොවන්නේ ද?

ජනතාවගේ ජීවන වියදම සැලකිය යුතු ප්‍රමාණයකින් නැංවීමටද එමගින් මම උපස්ථම්භක වෙමි. යම් භාණ්ඩයක් මිලයට ගන්නා හැම විට ම එම භාණ්ඩය පිළිබඳ ප්‍රචාරක සාහිත්‍යය සඳහා වැයවූ මුදලින් කොටසක් ද පාරිභෝගිකයා විසින් ගෙවිය යුතු වන හෙයිනි. එහෙයින් ප්‍රචාරක මාධ්‍ය සඳහා වන වැය අඩු වන විට

# පිළිසඳර

( ස්වාභාවික සම්පත් බල ශක්ති හා විද්‍යා අධිකාරියේ තොරතුරු අධ්‍යක්ෂ එන්. යූ. යාපා මහතා දත්ත සංදේශනය හා විඥාපන හුවමාරු ජාල පිළිබඳව විශේෂඥ කණ්ඩායම් සම්මන්ත්‍රණයකට (Experts Group Meeting on Data Communication and Information Exchange Net Work) පසුගියදා සහභාගිවිය. මෙම සම්මන්ත්‍රණය 1987 සැප්තැම්බර් 02 දින සිට 4 දක්වා චීනයේ පීකිං නගරයේ දී පැවැත්විණි. එම සම්මන්ත්‍රණය පිළිබඳවත්, චීනයේ පුස්තකාල පිළිබඳවත් කරුණු දැන ගැනීමේ අරමුණින් කරන ලද පිළිසඳරක දී.)

**ප්‍රශ්නය :** මෙම සම්මන්ත්‍රණයේ ප්‍රධාන අරමුණ කුමක්ද ?

**පිළිතුර :** යුනෙස්කෝ අනුග්‍රහය ඇතිව චීනයේ විද්‍යා හා තාක්ෂණික විඥාපන මධ්‍යස්ථානය මගින් මෙම සම්මන්ත්‍රණය සංවිධානය කර තිබුණා. මෙයට සහභාගී වූයේ ආසියාවේ සහ පැසිපික් කලාපයට ආශ්‍රිත රටවල විඥාපන මධ්‍යස්ථාන හා විදුලි සන්දේශ ආයතන නියෝජිතයන් ය.

ආසියාතික හා පැසිපික් කලාපයට ආශ්‍රිත රටවල් අතර ක්ෂණික තොරතුරු හුවමාරුවක් සඳහා පරිගණක සම්බන්ධ කළ තොරතුරු ජාලයක් (Net Work) ඇති කිරීමට යුනෙස්කෝවේ අරමුණ කර ගෙන තිබෙනවා. මෙම වැඩ පිළිවෙළ නම් කරලා තියෙන්නේ 'ඇස්ටින්ෆෝ' (Astinfo) කියලා. සෑම රටකම මධ්‍යස්ථානයක් ඇති කරලා එම මධ්‍යස්ථාන මගින් අනිත් රටවල මධ්‍යස්ථාන සමග පරිගණක, මගින් සම්බන්ධ කිරීම මෙහි අරමුණයි. මේ මගින් ඒ ඒ රටවල විද්‍යාත්මක තොරතුරු හා අත්දැකීම් හුවමාරු කර ගැනීම සඳහා පහසුකම් සැලසෙනවා.

මෙම අරමුණ ක්‍රියාත්මක කිරීමේදී ඒ ඒ රටවල පරිගණක හා විදුලි සංදේශ ක්‍රමවල දියුණුව සැලකිල්ලට ලක්වුණා. මේ යටතේ විශේෂ විමසීමකට යොමු වුනේ දත්ත හුවමාරුව සඳහා යොදාගත හැකි විදුලි සන්දේශ ක්‍රම ගැන.

නව තාක්ෂණය අනුව දියුණු විදුලි සංදේශ ක්‍රම ඇති රටවල් මෙම වැඩ පිළිවෙළට මුලින්ම සහභාගි කරවා ගැනීමටත්, ඒ අනුව ගොඩනැගුණු තොරතුරු ජාලය යුරෝපය, ඇමරිකාව වැනි රටවලට ව්‍යාප්ත කිරීමටත් යුනෙස්කෝව බලාපොරොත්තු වෙනවා.

**ප්‍රශ්නය :** පුස්තකාල විද්‍යා ක්ෂේත්‍රය පිළිබඳව සෑම විටම අවධානයකින් සිටින ඔබ මෙම කෙටි කාලය තුළදී චීනයේ පුස්තකාල රටාව හා තොරතුරු මධ්‍යස්ථාන පිළිබඳව ලබා ගත් දැනුම කැටි කළහොත් මොන විදියේ සඳහනක් ද කළ හැක්කේ ?

**පිළිතුර :** චීනයේ පුස්තකාල පාලනය වන්නේ සංස්කෘතික අමාත්‍යාංශය යටතේ, මෙම අමාත්‍යාංශ යටතේ පුස්තකාල සේවා දෙපාර්තමේන්තුවක් තියෙනවා. තොරතුරු මධ්‍යස්ථාන ගැන කථා කිරීමේදී චීනයේ විද්‍යා තොරතුරු බෙදා හැරීම සඳහා රාජ්‍යතන්ත්‍රයේ සිට ගැමි ජනතාව දක්වා පැතිරුණු රටාවක් තහවුරු කර තිබෙනවා. චීනයේ පාලන ක්‍රමය අනුව මධ්‍ය රජය මුළු රටට බලපාන පාලනයක් ගෙන යන අතර එක් එක් ප්‍රාන්ත සඳහා වෙනම ප්‍රාන්ත රාජ්‍යයන් තිබෙනවා. මධ්‍ය රජයේ විවිධ අමාත්‍යාංශවල තොරතුරු මධ්‍යස්ථාන ඇති අතර මෙම මධ්‍යස්ථාන වල කටයුතු සම්බන්ධීකරණය සඳහා ජාතික විද්‍යා තාක්ෂණික තොරතුරු මධ්‍යස්ථානයක් පිහිටුවා තිබෙනවා. ඒ වගේම, ප්‍රාන්ත රාජ්‍යවල ඇති විවිධ අමාත්‍යාංශවල වෙන් වශයෙන් එම ප්‍රාන්ත අමාත්‍යාංශ වලට අදාලව තොරතුරු මධ්‍යස්ථාන පවත්වා ගෙන යනවා. විශේෂ විෂයයන් සඳහා රට පුරාම පැතුරුණු තොරතුරු මධ්‍යස්ථාන පදනම් කර ගෙන තොරතුරු ජාල ආරම්භ කර ගෙන තිබෙනවා. සුළු කර්මාන්ත අමාත්‍යාංශය මගින් පවත්වා ගෙන යන බයිසිකල් කර්මාන්ත තොරතුරු ජාලය මෙබඳු සියයක් පමණ වූ තොරතුරු ජාල වලින් එකක්.

**ප්‍රශ්නය :** මම නැවතත් ඔබේ අවධානය යොමු කරනවා මුලින්ම කළ විස්තරයට. යුනෙස්කෝව මගින් සැලසුම් කර ඇති විද්‍යාත්මක නව තොරතුරු බෙදා හැරීමේ තොරතුරු ජාලය පිළිබඳවත් ඒ හා උපයෝගී කර ගන්නා ක්‍රම පිළිබඳවත් මේ ගැන උනන්දුවක් දක්වන අයගේ අවධානයට යොමු කළ යුතුයි නේද ?

**පිළිතුර :** ඔව්. මීළඟ පුස්තකාල ප්‍රවෘත්ති කලාපයට මම ඒ පිළිබඳව විස්තරාත්මක ලිපියක් ලියන්නම්.

**පිළිසඳරේ යෙදුණේ - එච්. එන්. පීරිස්**

හෝ අරපිරිමැස්මෙන් යුතුව ප්‍රචාරක කටයුතු කරන විට භාණ්ඩයේ මිල ද ඊට අනුපාතිකව පහත දැමිය හැකි වේ.

තාවකාලික වැදගත්කමකින් යුත් වෙළඳ ප්‍රචාරක සාහිත්‍ය සම්බන්ධයෙන් පමණක් නොව ස්ථාවර වැදගත් කමකින් යුත් මුද්‍රිත තොරතුරු මාධ්‍ය සම්බන්ධයෙන් ද මෙම තත්වය ම බලපායි. දීර්ඝ කාලීන ශාස්ත්‍රීය ගවේශණයක ප්‍රතිඵල අළලා ලියැවුණු පොතක් මුද්‍රණයෙන් බිහිවූ විට එහි පිටපත් පුද්ගලයින් හෝ පුස්තකාල විසින් මිලදී ගනු ලැබේ. ඇතැම් විට පුද්ගලයකු විසින් එසේ මිලදී ගන්නා ලද පොතකින් ඔහුට අවශ්‍ය තොරතුරු ප්‍රමාණය ගැබ්වී ඇත්තේ පොතේ පිටු කිහිපයක පමණක් විය හැකිය. ඔහු එය කියවා බලා පොත රාක්කයේ තබයි. පුස්තකාලයකට ලබා ගත් පොතක් නම් එම පොත තීමා කිරීම, බැඳීම, තැන්පත් කිරීම සඳහා අවශ්‍ය රාක්කගත හා භූමිගත ඉඩ ප්‍රමාණය එම පොත සංරක්ෂණය සඳහා වැය වන ඉන්ධන හා විදුලි බලයේ වටිනාකම, පොත පිරිසිදු කිරීම, ධූලි පිසීම වැනි නඩත්තු කාර්යයන් සඳහා වැයවන විශාල ශ්‍රමය හා වියදම් ජනතාව අතර පොදුවේ බෙදී යන හෙයින් අපට එහි බරපතලකම වහා ම නොවැටහේ.

ශ්‍රමය හා මුදල් විනාශය තාවකාලිකව අමතක කර දමමු. අප මුද්‍රිත සාහිත්‍යය අයත් කොට ගෙන පවත්වා ගැනීම සඳහා වැය කරන ශ්‍රමයට හා මුදලට සරිලන ප්‍රතිලාභ හැම විටම අපට එමගින් ලැබේද ? මීට දිය යුතු පිළිතුර සාම්ප්‍රදායික පුස්තකාලයාධිපතීන් වන අපට ඉතා අමිහිරි එකක් විය හැකිය. එහෙත් හිතට එකගව කථා කළහොත් 'නැත' යන්න හැර වෙන කුමන පිළිතුරක් අපට දිය හැකිද ?

අඛණ්ඩ තොරතුරු සැපයුම් අද අප ජන ජීවිතයේ ප්‍රාණ වායුව බවට පත්වී ඇත. හැම මොහොතක් පාසාම නව තොරතුරු බිහිවෙමින් පවතී. මහා කාර්මික ව්‍යාපෘති, වෙළඳ ව්‍යාපාර, නිෂ්පාදන සංවිධාන මෙන්ම රාජ්‍ය කටයුතුවල පවා සාර්ථකත්වය රඳා පවත්නේ තොරතුරු සැපයුම මත ය. එහෙයින් තොරතුරු සැපයුමකින් තොරව අපට ජීවත් විය නොහැකිය. එසේ නම් වඩාත් පිරිමැසුම් දායක ලෙසත්, කාර්යක්ෂම ලෙසත් තොරතුරු ගබඩා කිරීම හා බෙදා හැරීම සඳහා ඇති විකල්පය කුමක්ද ? මේ සඳහා අපට විකල්ප රාශියක්ම බිහිවී ඇත. විද්‍යුත් තාක්ෂණය පදනම් කොටගත් ඒ එකදු විකල්පයක්වත් තවම සම්පූර්ණයෙන් වර්ධනය වූ ඒවා නොවේ. තවමත් දියුණු වෙමින් පවත්නා ඒවාය. එහෙත් එකක් නම් කිව හැකිය. තොරතුරු ගබඩා කිරීමටත් ක්ෂණයකින් සැපයීමටත් හැකි මාධ්‍යයක් බිහිවන දිනය අත ළඟ බවයි. තොරතුරු මාධ්‍ය නිෂ්පාදනයේ ප්‍රවණතාවක් පිළිබඳව අවබෝධයක් ලත් විට ඉහත කී අනාවැකිය වඩාත් ආත්ම විශ්වාසයකින් යුතුව හා නො පැකිළ පළ කිරීමට අපට හැකිවනු ඇත.

## දෘශ්‍ය දත්ත ප්‍රකාශන ( View data )

පරිගණක දත්ත බැංකු බිහිවීමේ අනියම් ප්‍රතිඵලයක් ලෙස මෙම තොරතුරු ප්‍රකාශන මාධ්‍යය සැලකීම වඩාත් සුදුසු ය. මෙම තොරතුරු මාධ්‍යයෙන් තොරතුරු විකාශනය කරන ක්‍රම දෙකක් වෙයි. ප්‍රථම ක්‍රමය නම් සාමාන්‍ය රූපවාහිනී තරංග මාලාවක් ඔස්සේ දත්තයන් ප්‍රචාරය කිරීමයි. විද්‍යුත් තොරතුරු ( **teletext** ) නමින් හැඳින්වෙන මෙම ක්‍රමය මගින් දිනයේ වැදගත් තොරතුරු හා විවිධ දෛනික වැදගත්කමකින් යුත් පුවත් රූපවාහිනී තිරය මත දවසේ නියමිත වේලාවන්හිදී ප්‍රදර්ශනය කෙරේ. මෙම ක්‍රමයේ ඇති දුර්වලතාවය නම් තමාට අදාළ පුවත් ඛණ්ඩය ප්‍රචාරය වනතුරු පාඨකයාට බලාගෙන සිටීමට සිදුවීමයි. තොරතුරු ප්‍රචාරණය කරනු ලබන්නේ ප්‍රචාරකයින් විසින් තීරණය කරන ලද පිටු අංක අනු පිළිවෙළකට අනුව හෙයිනි. මෙම ක්‍රමය කෙටි තොරතුරු කිහිපයක් ප්‍රචාරය කිරීමට සුදුසු වුවද කාර්ය බහුල සමාජයක අවශ්‍යතා ඉටු කිරීමට තරම් ප්‍රමාණවත් නොවේ. මෙම තොරතුරු ලබා ගැනීම සඳහා විශේෂ උපකරණ කිසිවක් අවශ්‍ය වන්නේද නැත. අවශ්‍ය වන්නේ රූපවාහිනී යන්ත්‍රය පමණකි. සී ෆැක්ස් ( **ceefax** ) ඔරකල් ( **oracle** ) යන වෙළඳ නාම වලින් යුතු තොරතුරු සේවා **3** ක් බ්‍රිතාන්‍යයේ ක්‍රියාත්මකව පවතී.

දෙවන ක්‍රමය මෙයට වඩා බොහෝ ඉදිරියෙන් සිටින්නකි. ඊට හේතුව නම් මෙම ක්‍රමය උපයෝගී කොට ගෙන ග්‍රාහකයාට අභිමත පරිදි අවශ්‍ය තොරතුරු අවශ්‍ය අවස්ථාවේදී ලබා ගත හැකි හෙයිනි. මෙයින් අදහස් කරන්නේ ග්‍රාහකයාට මෙම සේවාව සමග ප්‍රතිචාර දැක්විය හැකි බවයි. ඒ නිසා මෙම සේවාවෙන් ප්‍රයෝජන ගැනීමට නම් රූපවාහිනී යන්ත්‍රය පමණක් තිබීම ප්‍රමාණවත් නො වේ. රූපවාහිනී යන්ත්‍රයට ඈඳන ලද විශේෂ ග්‍රාහක සම්බන්ධකයක් (**link**) අවශ්‍යය. කුඩා යතුරු ලියනයක් වැනි මෙම සම්බන්ධනය මගින් තමන්ට අවශ්‍ය තොරතුරු කෙළින්ම රූපවාහිනී තිරය මත පිළිඹිබු කරවා ගත හැකිය.

මෙම සේවාවට තොරතුරු සපයන්නන් වෙත යම් නියත පිටු අංක සංඛ්‍යාවක් පවරා දී ඇත. තමන් විසින් මිල දී ගෙන ඇති පිටුවල අඩංගු තොරතුරු සංශෝධනය කිරීම, යාවත්කාල කිරීම ආදී සියලු කටයුතු තොරතුරු සපයන්නන්ගේ වගකීම වෙයි. නිදසුනක් වශයෙන් බ්‍රිතාන්‍යයේ පුස්තකාල සංගමය ප්‍රෙස්ටල් ( **Prestel** ) වෙළඳ නමින් හැඳින්වෙන තොරතුරු සේවාවේ පිටු 10 ක් මිල දී ගෙන ඇත. එම පිටු 10 යෙහි තොරතුරු ඇතුළත් කරන්නේත්, නිරතුරුවම යාවත්කාල බවට පත් කරන්නේත් එම සංගමය විසිනි.

ප්‍රෙස්ටල් සේවාවට තොරතුරු සපයන්නන් හා ඔවුන්ට හිමි ප්‍රෙස්ටල් පිටු (රාමු) අංක දැනගන්නා ග්‍රාහකයා තමන්ට අභිමත පිටු අංකය තම සම්බන්ධකයේ යතුරු පුවරුව මගින් ටයිප් කළ විට අදාළ පිටුව ක්ෂණිකව තම රූපවාහිනී තිරයේ දිස්වනු ඇත. එම සම්බන්ධකයෙන් යතුරු ලියන ලද අංකය ප්‍රෙස්ටල් දත්ත බැංකුව වෙත දුරකථන ජාලය ඔස්සේ සම්ප්‍රේ-

ෂණය කරනු ලබන අතර ප්‍රෙස්ටල් දත්ත බැංකුවෙන් උපුටා ගන්නා අදාළ තොරතුරු එමගින්ම ග්‍රාහකයාගේ රූපවාහිනී යන්ත්‍රයෙන් තිරය වෙත සම්ප්‍රේෂණය කරනු ලැබේ.

අභිමතය පරිදි තොරතුරු තෝරාගත හැකි සේවාවක් ලෙස බිහිවූ ප්‍රෙස්ටල් සේවා ව පසුගිය වසර කිහිපය තුළදී විශාල දියුණුවක් ලබා ඇත. ඉන් කිහිපයක් පහත දැක්වේ.

ආරම්භයේදී ප්‍රෙස්ටල් සේවා ව මගින් තොරතුරු සපයන ලද්දේ සම ප්‍රමාණයේ අකුරුවලින් සමන්විත ලේඛන වශයෙනි. එහෙත් මෙය එතරම් ග්‍රාහකයාගේ සිත් ඇද ගන්නා සුළු නොවේ. සී ෆැක්ස් හෝ ඔරකල් වැනි සේවාවන්ට ග්‍රාහකයන් විසින් දක්වන ඇල්මැරුණු ප්‍රතිචාරවලින් ඒ බව මොනවට පැහැදිලි වේ. බොහෝ විට ග්‍රාහක අවධානය හරිහැටි තොරතුරු ඇතුළත් රාමු වලට යො මු නො වීම නිසා ඇතැම් තොරතුරු පාඨකයාට නොලැබී යාමද ඇතැම් විට සිදුවේ. එහෙත් ප්‍රෙස්ටල් දත්ත බැංකුව විසින් උපයෝගී කරගන්නා ලද විශේෂ පරිගණක වැඩ සටහන් උපයෝගී කොට ගෙන තම වෙළඳ දැන්වීම් හෝ තොරතුරු රාමු වඩාත් සිත් ඇද ගන්නා ආකාරයටත් ග්‍රාහක අවධානයට පහසුවෙන් හසුවෙන අන්දමටත් සකස් කිරීමට අද හැකිවී ඇත. තොරතුරු වෛවර්ණීයෙන් ඉදිරිපත් කිරීම, චිත්‍ර සටහන් උපයෝගී කොට ගැනීම, විවිධ ප්‍රමාණයේ අකුරු යොදා ගැනීම වැනි විවිධ ක්‍රම අද බහුලව භාවිතයේ පවතී.

ප්‍රෙස්ටල් සේවාවේ ඇති තවත් වැදගත් අංගයක් නම් එම සේවාව මගින් තොරතුරු සපයනු ලබන විවිධ භාණ්ඩ ගෙදර සිටම ඇණවුම් කිරීමට ග්‍රාහකයන්ට අවස්ථාව ලැබීමයි. ප්‍රෙස්ටල් සේවාවට තොරතුරු සපයන වෙළෙන්දෝ බොහෝ වෙති. යම් නව උපකරණයක් හඳුන්වා දීමට ඔව්හු ඒ පිළිබඳ විස්තර තම ප්‍රෙස්ටල් පිටුවට ඇතුළත් කරති. එය දකින ග්‍රාහකයාට මෙම උපකරණය මිල දී ගැනීමට හෝ ඒ ගැන වැඩි දුර තොරතුරු ලබා ගැනීමට හෝ අවශ්‍ය වෙයි. ඔහු කරන්නේ තම ප්‍රෙස්ටල් සම්බන්ධකය මගින් අදාල ඇණවුම හෝ ඉල්ලුම සපයන්නා වෙත සම්ප්‍රේෂණය කිරීමයි. සපයන්නා වෙත ඇති තිරයෙහි (Screen) හෝ එසේත් නැත්නම් ප්‍රෙස්ටල් අග්‍රයට සම්බන්ධ කරන ලද මුද්‍රණ යන්ත්‍රයක හෝ ග්‍රාහකයාගේ ප්‍රතිචාරය මුද්‍රණය වේ. එවිට සපයන්නා අදාල පරිදි කටයුතු කරයි.

ප්‍රෙස්ටල් ග්‍රාහකයන් අතර අන්‍යෝන්‍ය වශයෙන් තොරතුරු හුවමාරු කර ගැනීමටද මෙම සේවාවෙන් පහසුකම් සැලසේ. නිදසුනක් වශයෙන් මගේ මිතුරාගේ උපන් දිනය ළඟ එන්නේ නම් හා ඔහු ප්‍රෙස්ටල් ග්‍රාහකයෙක් ද වන්නේ නම් ඔහුට උපන් දින සුභ පැතුමක් යැවීම මට තත්පර කිහිපයකින් කළ හැකිය. එය වඩාත් අලංකාර ලෙස කිරීමට උපයෝගී කොට ගත හැකි උපන්දින සුභ පැතුම් සඳහා විශේෂයෙන් සැරසිලි යෙදූ ප්‍රෙස්ටල් රාමුවක් යොදා ගත හැක. නැතහොත් මට ම රාමුවක් සැලසුම් කර ගත හැකිය. එහෙයින් මා කරන්නේ මගේ ප්‍රෙස්ටල් සම්බන්ධකය මගින් අවශ්‍ය පණිවිඩය යතුරු ලියා එය සම්ප්‍රේෂණය කළ යුතු දිනයද ඊට ඇතුළත් කිරීමයි. තම උපන් දිනයේදී එහි ප්‍රෙස්ටල් සම්බන්ධකය ක්‍රියාත්මක කළ විගස මගේ මිතුරාගේ රූපවාහිනී තිරය මත මගේ සුභ පැතුම අනිවාර්යයෙන් ම පිළිබිඹුවී මගේ මිතුරා ප්‍රබෝධයට පත්වනු ඇත. හුදු අනපේක්ෂිත අයුරින් සුභ පැතීමේ මෙයටත් වඩා ප්‍රබල විස්කම් ක්‍රම නුදුරු අනාගතයේදී බිහිවනු ඇත. මෙම ක්‍රමයම චිත්‍රගත කිරීම්, කෙටි තොරතුරු සැපයීම් ආදී දහසක් අවශ්‍යතා සඳහා යොදා ගත හැක.

දෘශ්‍ය දත්ත සේවාව ඉතා නුදුරු අතීතයේ දී තවත් පියවරක් ඉදිරියට තැබුවේය. එනම් තමන්ගේ බැංකු කටයුතු, මුදල් කටයුතු ආදී ඉතා පෞද්ගලික කාර්යයන් පවා ප්‍රෙස්ටල් සේවාව ඔස්සේ ඉටු කර ගැනීමට ග්‍රාහකයාට අවස්ථාව සලසා දීමයි. මෙම සේවාව හැඳින්වෙන්නේ ගේට්වු ක්‍රමය (Gate way) නමිනි. මෙහි ඇති විශේෂත්වය නම් ග්‍රාහකයා ලබා ගන්නා තොරතුරු පිටස්තර අයෙකුට ලබාගත නො හැකි වන සේ රහස්‍ය භාවය රැකීමට විධි විධාන යොදා තිබීමයි. ගේට්වු සේවාව ක්‍රියා කරන්නේ මෙසේය.

ප්‍රථමයෙන්ම ග්‍රාහයන්ට තමන්ගේ තොරතුරු පමණක් ලබා ගැනීම සඳහා ගේට්වු විවෘත කර ඇත. දත්ත බැංකු මගින් අදාල ග්‍රාහකයන් වෙත රහස්‍ය අනන්‍යතා අංකයක් (ID. No.) හා අවසර අංකයක් (Pass word) සපයනු ලැබේ. ග්‍රාහකයා ප්‍රෙස්ටල් සම්බන්ධකය මගින් ප්‍රෙස්ටල් දත්ත බැංකුවට පිවිස අනතුරුව අදාල තොරතුරු සපයන්නා තම අග්‍රය ට සම්බන්ධ කර ගනී. මීළඟට ඔහු විසින් කළ යුතු වන්නේ තමාගේ අනන්‍යතා අංකය හා අවසර අංකය ප්‍රෙස්ටල් සම්බන්ධකයේ යතුරු ලිවීමයි. එම අංක පරීක්ෂා කර බලන දත්ත බැංකුව අංක නිවැරදි නම් පාඨකයාට අවශ්‍ය ඔහුට අදාල තොරතුරු පමණක් සපයයි. මෙබඳු ගේට්වු සේවා නිවාස සංගම් (Building Societies), බැංකු හා මූල්‍ය ආයතන විසින් බහුලව පවත්වා ගෙන යනු ලැබේ. එහෙයින් තමන්ගේ ගිණුමේ බැරට ඇති මුදල් ප්‍රමාණය ගෙදර සිටම දැනගැනීමට ග්‍රාහකයාට එමගින් අවස්ථාව ලැබේ. එහෙත් වෙනත් අයගේ ගිණුම් පිළිබඳ තොරතුරු ඔහුට මෙමගින් සපයාගත නො හැකි වන පරිදි දත්තවල රහස්‍ය භාවය මෙම ක්‍රමයේදී සුරැකී ඇත.

පාඨකයන්ට අවශ්‍ය විවිධ තොරතුරු සිය පරිගණක යන්ත්‍රය මෙහෙයවා ලබා ගත හැකි පරිදි පවත්වා ගෙන යන දත්ත බැංකු රාශියක් අද බිහිවී ඇත. ආරම්භයේදී ඉතා කෙටි තොරතුරු ඛණ්ඩ සැපයීමට පමණක් සීමා වූ මෙම දත්ත බැංකු අද විශාල තොරතුරු වශයෙන් මාර්ග ගත දත්ත බැංකු බවට පත්වී ඇත. බ්‍රිතාන්‍යය, ඇමෙරිකාව, ජපානය වැනි දියුණු රටවල ඇති මෙම දත්ත බැංකුවල සේවාවන් බොහෝ විට ලබා ගන්නේ සාමාන්‍ය තොරතුරු

අවශ්‍යතාවල ඇති පොදු ජනතාව විසින් නොව දේශපාලකයන්, කලමනාකරුවන්, වෘත්තීය විශේෂඥයන් ආදීන් විසිනි.

දත්ත බැංකු වර්ග දෙකක් අද අපට දැකගත හැකිය. ඉන් ප්‍රථම වර්ගය විසින් යම් විෂයක් පිළිබඳව සාහිත්‍යයට මග පෙන්වීමක් කරන අතර දෙවන වර්ගය අදාල තොරතුරු සම්පූර්ණයෙන්ම පාඨකයාට සපයයි. දත්ත බැංකු රාශියක් එක් සංයුක්තයක් ලෙස ගොඩ නගා ගත් දත්ත බැංකු ජාලාද අද බිහිවී ඇත. Euronet, Diane, Dialogue ආදිය ඊට නිදසුන්ය.

ඩයලොග් දත්ත බැංකුව වෙතින් විද්‍යාව, සමාජ විද්‍යා, තාක්ෂණය, රසායන විද්‍යාව, වෛද්‍ය විද්‍යා, ඉංජිනේරු විද්‍යා, ආර්ථික විද්‍යා වාණිජ්‍යය හා කාලීන සිදුවීම් යන විෂය ක්ෂේත්‍රවල තොරතුරු ලබා ගත හැකි වේ. තම අවශ්‍යතා පරිදි ලේඛන සෙවීම, ලේඛන වල ග්‍රන්ථ විඥපන තොරතුරු ලබා ගැනීම හෝ ලේඛනයේ සම්පූර්ණ පිටපතක් ඇණවුම් කිරීම මෙමගින් කළ හැකිය. සම්පූර්ණ පිටපත් සැපයීමේදී මෙම සේවා විසින් කරන්නේ ග්‍රාහකයාගේ විස්තර ප්‍රකාශනයට සපයා මුද්‍රිත කෘතියේ පිටපතක් ඔහු නමට ඇණවුම් කිරීමයි.

මෙම දත්ත බැංකුව නිර්මිත වී ඇත්තේ දත්ත බැංකු 200 කට අධික සංඛ්‍යාවක් එකතු වීමෙනි. බ්‍රිතාන්‍යයේ ඩේටාසෝල්ව් සමාගම විසින් පවත්වාගෙන යනු ලබන "වර්ල්ඩ් රිපෝටර්" දත්ත බැංකුව මගින් විශ්ව ප්‍රවෘත්ති නියෝජන ආයතන, පුවත්පත්, ගුවන් විදුලි ප්‍රචාරක වැනි සංවිධානවලින් දිනපතා ලබා ගන්නා තොරතුරු සම්පූර්ණ ලේඛන වශයෙන් ග්‍රාහකයන්ට සපයයි. තමන්ට අවශ්‍ය විෂය ශීර්ෂය හෝ නාමය යටතේ ග්‍රාහකයාට මෙම දත්ත බැංකු පිරික්සා අවශ්‍ය ලේඛන කියවා බැලිය හැකිය. 1979 සිට ලන්ඩනයේ පින්ස්බරි ඩේටා සර්විසස් සමාගම විසින් පවත්වා ගෙන යන "නිව්ස් ලයින්" සේවාව තවත් එවැනි සේවාවකි. දෛනික හා සතිපතා පුවත්පත් 40 ක ඇතුලත් ප්‍රවෘත්තිවල සාරාංශයක් මෙමගින් ග්‍රාහකයාට ලබා ගත හැක. මෙම දත්ත බැංකුව විසින් සපයන තොරතුරු වාණිජ හා කර්මාන්ත ක්ෂේත්‍රයට සීමා වේ.

වෙළඳ බලපත්‍ර පිළිබඳ තොරතුරු සපයන පර්ගමම් සමාගම විසින් පාඩත්තු කරනු ලබන ඉන්පාඩොක් (**Inpadoc**) බැංකුවෙහි පේටන්ට් දසලක්ෂයක් පිළිබඳ තොරතුරු ගබඩා කොට ඇත. ඊසා (**esa**) දත්ත බැංකුව විද්‍යාව හා අජටාකාශ තරණය පිළිබඳව වාර්තා කෝටි තුනක් ගබඩා කර ගෙන ඇත. බ්‍රිතාන්‍ය පුස්තකාලයේ බ්ලේස් සේවාව (**Blaise**) රසායන විද්‍යාව පිළිබඳ රාජකීය සමිතිය විසින් පවත්වා ගෙන යන **සී. බී. නිව්ස් බේස් (C. B. News Base)** රටවල් 20 ක ව්‍යාපාර තොරතුරු අළලා බ්‍රිතාන්‍ය සමාගමක් විසින් බිහිකර ඇති කෝඩා ඔන් ලයින් (**Koda On line**) රටවල් 17 ක වෙළඳ සමාගම් පිළිබඳ තොරතුරු සපයන ඩේට් ලයින් (**Date line**) වැනි පෞද්ගලික තොරතුරු සේවා දහස් ගණනක් අද බිහිවී ඇත.

ඉහත දක්වන ලද්දේ මුද්‍රිත මාධ්‍ය හා තරංග වැදී සිටින තොරතුරු ගබඩා කිරීමේ හා ප්‍රකාශයට පත් කිරීමේ එක් මාධ්‍යයක් සම්බන්ධයෙන් පමණකි. තොරතුරු ගබඩා කිරීමට බහුලව යොදා ගැනෙන චුම්භක මාධ්‍ය (**Magnetic media**) හා දෘශ්‍ය මාධ්‍ය (**Optical media**) පිළිබඳවත් ලේඛන සම්ප්‍රේෂණය පිළිබඳවත් පසුව සලකා බලමු.

# ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය සඳහා ග්‍රන්ථ රැස්කිරීම

නුදුරු අනාගතයේ විවෘත කිරීමට බලාපොරොත්තු වන ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය සඳහා ග්‍රන්ථ රැස් කිරීම ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය මගින් දැන් කර ගෙන යනු ලැබේ.

ශ්‍රී ලංකාවට අදලවන පොත පත, වාර සඟරා හා වෙනත් ශ්‍රව්‍ය-දෘශ්‍ය මාධ්‍ය ජාතික පුස්තකාලයේ තැන්පත් කිරීම සඳහා පරිත්‍යාග කරන මෙන් ඉල්ලා සිටිමි.

බෞද්ධ වෙහෙර විහාර හා වෙනත් ආගමික ආරාමයන්හි අනාරක්ෂිතව ඇති පුස්කොළ පොත් ඇතුළු ඓතිහාසික ලේඛන සංරක්ෂණය කර ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ ආරක්ෂා කෙරෙනු ඇත.

දැනට පුස්තකාලවලින් බැහැර කෙරෙන පොත්පත් ආදියද ජාතික නිදන් පුස්තකාලය වෙත එවිය හැකිය. මේ සියලුම පොතපත හා ලේඛනයක්ම අනාගත ජාතික අවශ්‍යතාවන් සඳහා සංරක්ෂණය කර තැන්පත් කරනු ලැබේ.

මේ පිළිබඳ වැඩිදුර විස්තර ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ අධ්‍යක්ෂ/ලේකම් වරයාගෙන් ලබා ගත හැකි බව කාරුණිකව දන්වමි.

**සභාපති,**
**ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය**

තැ. පෙ. 1764
නිදහස් මාවත,
කොළඹ 07.
දුරකථන : 598847, 95200
95201, 95202

# සිතියම් එකතුන් හා මහජන පුස්තකාල

සිතියම් එකතුන් අයත් කර ගැනීම හා සංවර්ධනය, සංවිධානය, පාඨක සේවා සැපයීම යන කරුණු පිළිබඳව මහජන පුස්තකාලයාධිපතීන්ට උපදෙස් දීමේ අරමුණින් ප්‍රකාශයට පත්වුණු පොත්පත් ඇත්තේ සීමිත ප්‍රමාණයකි. එහෙත් පාඨක සේවාවේදී සිතියම් අධ්‍යයන තොරතුරු පිළිබඳ අවශ්‍යතාව කලක සිට පැවතිණි. එසේම මහජන පුස්තකාලවල සෑහෙන කාලයක සිට සිතියම් එකතුන් ද තැන්පත් කර තිබෙනු දක්නට ලැබේ, දහසය වන සියවසේ මුල්


**එච්. ඇම්. ගුණරත්න බණ්ඩා**

**පුස්තකාලයාධිපති, ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය.**


භාගයේ සිට ම ඓතිහාසික භූවිද්‍යාත්මක විෂය ක්ෂේත්‍ර අධ්‍යයනය ආරම්භ වූ අතර සිතියම් එකතුන් ඇති කිරීමට එය ප්‍රධාන හේතුවක් විය. මහජන පුස්තකාල හා පෞද්ගලික විශේෂ එකතුන් තිබූ පුස්තකාල, සිතියම් අයත් කර ගැනීමට විශේෂයෙන් පෙළඹිණි. එකල රටවල් ගවේශණය කිරීමේ ගමන් සඳහා සිතියම් එකතු කිරීම අත්‍යාවශ්‍ය විය. නූතනයේ දී ද වෙනත් විවිධ අරමුණු හා කාර්යයන් උදෙසා සිතියම් එකතු කිරීම ආරම්භ කර ගෙන යනු දක්නට ලැබේ. වර්තමානයේ දී සිතියම් භාවිතය මගින් අධ්‍යයන කරුණු හැදෑරීම මෙන්ම එදිනෙදා ජීවිතයට අදාල කරුණු ද ලබා ගන්නා බව පෙනේ. උදා :- නැගෙනහිර යුරෝපයේ පරම්පරාගත වංශාවලීන් පිළිබඳව අධ්‍යයනයක් කරන මානව විද්‍යාඥයෙකුට අවශ්‍ය පැරණි ගමන් පිළිබඳ මූලික පසුබිම් කරුණු සිතියමක් මගින් ලබා ගත හැකිය. එමෙන්ම ශිෂ්‍යයෙකුට තමාගේ අධ්‍යයන කරුණුවලට අදාල වාර්තාවකට සිතියමක් මගින් කරුණු ලබා ගත හැකි වෙයි. විනෝද චාරිකාවක් සංවිධානය කරන පවුලකට ස්වාභාවික වන උද්‍යාන, ගංගා හා මාර්ග පිළිබඳ විස්තර සිතියම් මගින් ලබා දේ. ඒ අනුව මහජන පුස්තකාලයක විමර්ශන කටයුතු සඳහා තැන්පත් කර තිබෙන සිතියම් එකතුන්ට නිතැතින්ම විශේෂ ස්ථානයක් හිමි වන අතර ම ඒවා විධිමත් ලෙස සංවිධානය කර තැබීම බෙහෙවින් ප්‍රයෝජනවත් ය. මේ ලිපියේ මූලික අරමුණ වනුයේ ද සිතියම් මගින් ලබා ගත හැකි දැනුම ගැන විශේෂයෙන් ම පුස්තකාලයාධිපතීන්ට අවබෝධයක් ලබා දීම ය.

මහජන පුස්තකාලවල ඇති සිතියම් එකතුන් හි ස්වභාවය හා ප්‍රමාණය එකිනෙකට වෙනස් වුවත්, රැස්කර තිබෙන සීමිත ප්‍රමාණයෙන් වුව ද ලබා ගත හැකි ප්‍රයෝජන අති මහත් ය. මහජන පුස්තකාලයක සාමාන්‍යයෙන් සිතියම් තැන්පත් කර තැබීම, විමර්ශන අංශය, ඉතිහාසය හා පුරාවිද්‍යා කාමරය හෝ රජයේ ප්‍රකාශන අංශය යනාදී තැනෙක සිදු වුවත් පාඨකයන්ට මනා අන්දමින් ඒවා ප්‍රදර්ශනය වන අයුරින් තැබීමට අවධානය යොමු කළ යුතු වේ,

සමාරම්භයක් වශයෙන් ඔබේ සේවා ස්ථානය ගැන අවධානය යොමු කරන්න. ඉන්පසු එහි අරමුණු, කාර්යයන්, ක්ෂේත්‍ර පථය, ග්‍රාහක අවශ්‍යතා අධ්‍යයනය කිරීමෙන් ඔබේ සේවා ස්ථානය ගැන පැහැදිලි ආකල්පයක් ඇති කර ගත හැකි ය. මේ සියලු කරුණු පදනම් කර ගෙන ආයතනික ව්‍යුහයට අදාල ව සිතියම් එකතුවක් ගොඩ නැගීමේ කාර්යය ආරම්භ කළ හැකි ය. ආයතනික වශයෙන් ඔබේ සේවා ස්ථානය සිතියම් පිළිබඳ තොරතුරු විදහා දැක්වීමට පරිපාලනීය වගකීමක් භාර ගෙන ඇත් නම් එම සේවාව දියුණු කරලීමට අවශ්‍ය තවත් පියවර ගත යුතු වේ. එහිදී ඔබ ගේ වැඩ කරන කාර්යාල සේවා කාලය, අනෙකුත් කාර්ය මණ්ඩලය, ඉඩ ප්‍රමාණය, අවශ්‍ය උපකරණ හා මුදල් යන කරුණු ගැන සැලකිලිමත් විය යුතුය. සිතියම් එකතුන් භාරව පූර්ණ කාලීන පුස්තකාලයාධිපතිවරයකු යෙදවීමේ හැකියාව ඇත්තේ මහජන පුස්තකාල සුළු ප්‍රමාණයකට ය. එමෙන්ම සිතියම් එකතුන් සඳහා පූර්ණ කාලීන පුස්තකාලයාධිපතිවරුන් සුළු ප්‍රමාණයක් සිටිය ද ඔවුන් වැඩි කාලයක් ගත කරනුයේ අනෙකුත් වගකීම් හා බැඳී පවත්නා කාර්යයන් සඳහා ය. එවැනි දුෂ්කරතා මධ්‍යයේ වුව ද ක්‍රියාකාරී සැලැස්මකට අනුකූලව සැලසුම්, අරමුණු, ඉලක්ක හා ක්‍රියාමාර්ග සකසා ගත යුතුවේ.

ඊළඟට සුපරීක්ෂාකාරී ව සලකා බැලිය යුත්තේ දැනට පුස්තකාලය සතුව තිබෙන සිතියම් එකතුව කෙරෙහි ය. එහිදී ප්‍රශ්න කිහිපයක් පැන නගී. එනම් භූගෝලීය සාධක අනුව කෙතෙක් දුරට ව්‍යාප්තව ඇත්ද? පුස්තකාලවල ප්‍රවණතාවය කෙසේද? ආවරණය වී ඇති විෂය ක්ෂේත්‍ර කෙතෙක් දුරට සවිස්තර වේද? එකතුවෙහි පාඨක විඥාපන අවශ්‍යතා සපුරා ලීමේ හැකියාව කෙතෙක්ද? මේ කරුණු පසුබිම් කර ගෙන සිතියම්වල තත්ත්වය පාලනය මෙන් ම ප්‍රමාණාත්මක සාධකය කෙරෙහිද අවධානය යොමු කළ යුතුවේ. මෙය ක්‍රමානුකූලව කළ හැකි මාර්ගයක් නම් මේ සඳහා වෙන ම ආකෘතියක් සම්පාදනය කර භූගෝලීය සාධක වන ප්‍රාදේශීය කරුණු සීමා නිර්ණකයන්, සිතියමෙහි ස්වභාවය, භූ විෂමතාවය වාර්තා කිරීමයි. සෑම සිතියමක් ම ප්‍රාදේශීය සීමා නිර්ණකයන්, පිටු ප්‍රමාණය ආවරණය වී ඇති ප්‍රමාණය මෙන්ම සෑම සංස්කරණයකම සිතියම් ඒකරාශී වී ඇත්ද; සිතියම් වල අයත් කර ගැනීමේ ප්‍රතිපත්තිය කුමක්ද; එම සිතියම් පුස්තකාලය තුළ සංවිධානයේදී වර්ගීකරණය කර සුචිගත කර ඇත්ද; යන අයුරින් එක් එක් ප්‍රදේශය අනුව සැකසුණු සිතියම් පරීක්ෂා කිරීමෙන් පසු මුළු සිතියම් එකතුවම විමර්ශනයට භාජනය වන අතරම පුස්තකාලයේ ඇති සිතියම් පිළිබඳ මනා චිත්‍රයක් ඇති කර ගත හැකි වේ. එමෙන්ම සිතියම් බාරව සිටින පුස්තකාලයාධිපති වශයෙන් ඔබ ගේ දැනුම ද සීඝ්‍රයෙන් වර්ධනය වීමට අවකාශ ලැබෙනු ඇත. එම අවස්ථාවේදීම සිතියම් එකතුවෙහි අඩුපාඩු හා මගහැරී තිබෙන අවස්ථාවන් පහසුවෙන් දැක ගැනීමට හැකිවේ.

තමා සතුව තිබෙන සිතියම් එකතුවෙහි තත්ත්වය, ප්‍රමාණය, අවස්ථා ගැන පැහැදිලි වැටහීමක් ලබා ගැනීමෙන් අනතුරුව එළඹිය යුතු ප්‍රධාන කාර්යය වනුයේ පාඨක අවශ්‍යතා ගවේෂණය කිරීමයි. තමා ගේ ග්‍රාහක පිරිස ශිෂ්‍යයෝද? සාමාන්‍ය පාඨකයෝද? වෙළෙඳ ව්‍යාපාරිකයෝද? එසේ නොමැතිනම් රජයේ නිලධාරීහුද? ඒ සියලුම දෙනාම ගණනය කිරීමේදී නිශ්චිත කොපමණ පාඨකයින් ප්‍රමාණයක් සිටීද? කුමන මාතෘකා අනුව ඔවුන් සිතියම් විමර්ශනය කිරීමේ යෙදී ඇත්ද? මේ ආදි කරුණු පාඨක අවශ්‍යතා ගවේශණයේදී සැලකිය යුතු මූලික කරුණු කිහිපයකි. පාඨකයන් නියමාකාරයෙන් හඳුනා ගැනීමට උපකාරී වන මාර්ග කිහිපයකි. මහජන පුස්තකාලයකදී නම් පාඨක අවශ්‍යතා පහසුවෙන් ගවේෂණය කළ නොහැකි අතර පාසල්, අධ්‍යයන ආයතන පුස්තකාලයක නම් විෂය ධාරාව හෝ පර්යේෂණ ව්‍යාපෘති පදනම් කර ගෙන අවශ්‍යතා පිළිබඳ නිර්ණායකයන් ගොඩ නගා ගත හැකිවේ. කුඩා මහජන පුස්තකාලයකදී නම් එක් එක් පාඨකයකු වෙන් වශයෙන් ගෙන සම්මුඛ සාකච්ජා පවත්වා ඔවුන්ගේ අවශ්‍යතා පහසුවෙන් දැන ගත හැක. පුස්තකාලයෙහි ප්‍රමාණය විශාල නම් පුස්තකාලයාධිපතීන්ට වෙනත් මාර්ග සැලසුම් කිරීමට සිදුවේ.

පාඨක නිර්ණය සඳහා යොදා ගන්නා හොඳ ම ක්‍රමය වනුයේ පාඨක සමීක්ෂණයයි. පාඨකයා ගැන ඔබට අවශ්‍ය දේ දැන ගැනීමට උපකාරී වන අන්දමින් පාඨක සමීක්ෂණ සැලසුම් කර ගත හැකි ය. පාඨක ස්වභාවය, ඔවුන්ගේ ප්‍රධාන අවශ්‍යතා, එකතුව තුළින් එම අවශ්‍යතා කොතෙක් දුරට සපුරා ලිය හැකිද? එසේ නොමැති නම් පවත්වා ගෙන ආ සේවාවන් විධිමත් කළ යුත්තේ කෙසේද? යන කරුණු මනා අයුරින් දැන ගැනීමට පාඨක සමීක්ෂණ ඉවහල් වේ. සිතියම් එකතුව පුස්තකාලය තුළ පරිහරණය කරන ආකාරය පිළිබඳ නියමුවක් ද පාඨක සමීක්ෂණය මගින් ලබා ගත හැකිය. සිතියම් පුස්තකාලය තුළ ගබඩා කර ඇති බව සමහර අවස්ථාවලදී පාඨකයා පවා නොදනී. මෙවැනි තත්ත්වයන් සාර්ථක ලෙස මග හරවා ගත හැක්කේ පෞද්ගලික සම්බන්ධතා මගිනි. එමෙන්ම පුස්තකාල තුළ සිතියම් පරිහරණය කරනු ලබන පාඨකයින් වෙත සිතියම් නිරාවරණය කර දැක්වීමෙන් හා ඔවුන්ට අවශ්‍ය සිතියම් පිළිබඳ තොරතුරු ලබා දීමෙන් නිරතුරුවම පාඨකයෝ පරිහරණය පිළිබඳ හුරුවක් ලබා ගනිති. මෙහිදී ගත හැකි තවත් පියවරක් වනුයේ පුස්තකාලය පිහිටුවා ඇති බල ප්‍රදේශය තුළ ඇති ආයතන හා සංවිධාන වෙත දැන්වීමයි.

ඊළඟ ක්‍රියා මාර්ගය වනුයේ දැනට පුස්තකාල සතුව තිබෙන එකතුව පරීක්ෂා කර බැලීමයි. භූගෝලීය වශයෙන් ආවරණය කළ යුතු ප්‍රමාණය කෙතෙක්ද? එම ද්‍රව්‍යවල කාලීන ප්‍රවනතා තත්ත්වය කෙසේද? ආවරණය කරන ප්‍රමාණයේ සවිස්තරාත්මක භාවය කෙසේද? එකතුවෙහි පුළුල් භාවය සහ ප්‍රශ්න කෙරෙහි අවධානය යොමු කරමින් සිතියම් එකතුවෙහි තත්ත්ව හා ප්‍රමාණ නිරීක්ෂණයක් කළ යුතු ය. මෙය ක්‍රමානුකූලව සාර්ථකව ඉටු කළ හැක්කේ භූගෝලීය දේශ සීමා නිර්ණයට අදාල තොරතුරු වන ප්‍රමාණය වර්ග සහ විස්තර ඇතුළත්ව ක්‍රමික දත්ත සැලැස්මක් සකස් කිරීමෙනි. උදහරණයක් වශයෙන් ස්වේච්ඡා සංවිධාන, ග්‍රාම සංවර්ධන, ප්‍රජා මණ්ඩල, තරුණ හා ක්‍රීඩා සමිති දැක්විය හැකිය. පුස්තකාලය තුළ සිතියම් එකතුවක් ස්ථාපිත කිරීම සංවර්ධනය සඳහා ඇති නියම පාඨකයින් හඳුනා ගැනීම ප්‍රයෝජනවත් ය,

පවතින්නා වූ තත්ත්වය මත සිතියම් එකතුව පිළිබඳ ඒකාබද්ධ සැලැස්මක් හෝ එකතුව සංවර්ධන කිරීමේ දළ සටහන් ඇති කර ගැනීම ඊ ළඟ පියවර වේ. දැනට තිබෙන සිතියම් සංවර්ධනය සඳහා නව ඒකාබද්ධ සැලැස්මක් අවශ්‍ය නොවන අතර අලුතින් ම පුස්තකාලය තුළ සිතියම් එකතුවක් ගොඩ නැගීමට අපේක්ෂා කරන්නේ නම් ඒ සඳහා ඒකාබද්ධ සැලැස්මක් අත්‍යාවශ්‍ය ය. සුපරීක්ෂාකාරීව සම්පාදනය කරන ලද ඒකාබද්ධ සැලැස්මක් සඳහා පුස්තකාල කමිටුවේ හා පරිපාලන ව්‍යුහයේ සංශෝධන හා නිර්දේශ ඇතුළත ම ක්‍රියාවට නැගිය හැක. අයත් කර ගත යුතු සිතියම් වර්ග, ප්‍රමාණය, ආවරණය කළ යුතු විෂය ක්ෂේත්‍ර යනාදිය තීරණය වනුයේ ආයතනයේ

හෝ සංවිධානයේ පොදු පරමාර්ථවලට අනුකූලවය. සමතුලිත සිතියම් එකතුවක් සංවර්ධනය සඳහා මුළු එකතුවෙහි අරමුණු හා පරමාර්ථ මෙන්ම කෙටි, දිගු කාලීන සැලසුම් සැලකිල්ලට ගත යුතු වේ. සිතියම් පරිග්‍රහණය කඨිනම් හා කාර්යක්ෂම අන්දමින් සිදු කිරීම පුස්තකාලයාධිපතිට පැවරෙන වගකීමකි. මෙහිදී රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන මෙන්ම විදේශීය සංවිධාන කුමන සිතියම් සම්පාදනය කෙරේද: ඒවාට කෙලින්ම ඇණවුම් කර සිතියම් අයත් කර ගත හැකිද: එසේ නොමැති නම් මධ්‍යම රජයේ ආයතනයකින් ලබා ගත යුතුද ඒ සඳහා අනුගමනය කළ යුතු ක්‍රියා පිළිවෙළ කුමක්ද ආදිය පිළිබඳව මනා වැටහීමක් ලබා ගත යුතු වේ.

එකතුවක් තුළ කුමන සිතියම් තිබිය යුතුද යන්න පිළිබඳව පැහැදිලිව දක්වීමට ප්‍රමිතීන් නොමැති වුවත් මූලික, පොදු කරුණු කිහිපයක් පදනම් කර ගත හැකි වේ. ඇමරිකා එක්සත් ජනපදයේ ලෝක භූ විද්‍යාත්මක සිතියම අඟලට 1 : 14,000,000 සෑම පුස්තකාලයක් විසින්ම අයත් කර ගත යුතු එවැනි සිතියමකි. එය අනෙකුත් ලෝක සිතියම්වලට වඩා විශිෂ්ටත්වයක් දරනුයේ අන්තර්ජාතික දේශසීමා, ප්‍රධාන නගර, සාගර ආදිය පැහැදිලිව දක්වන නිසා ය. තම දේශයේ විශාල සිතියමක් අයත් කර ගැනීම මූලික සරල කරුණකි. පරිමාණය 1 : 500,000 ඇති ප්‍රාදේශීය හා දිස්ත්‍රික් සිතියම් ද ප්‍රයෝජනවත් ය. මේ සෑම සිතියමක ම ගංගා, වැව්, දිය ඇලි, ජලාශ, සංස්කෘතික ලක්ෂණ පරිමාණයේ ප්‍රමාණය මත රඳා පවතී. එසේම මහාමාර්ග, දුම්රිය ප්‍රවාහන මාර්ග, පතල්, සම්ප්‍රේෂණ මාර්ග, ජල නළ, ගුවන් පථ, ගොඩනැගිලි ජනාශ්‍රිත ප්‍රදේශ සහ අනෙකුත් ලක්ෂණ ද පෙන්නුම් කරයි. ප්‍රාදේශීය වශයෙන් හා දේශීය වශයෙන් මේ සියලු අංග ලක්ෂණ විදහා දක්වෙන සිතියම් අයත් කර ගැනීම පාඨක අවශ්‍යතා මත ම පමණක් නොව අත්‍යාවශ්‍යයෙන්ම තිබිය යුතු වේ. සිතියම්, මිල දර්ශන, අනුක්‍රමණිකා ඒ ඒ රටවල සම්බන්ධිත ආයතනවලින් ලබා ගත හැකි වේ. උදාහරණයක් වශයෙන් ශ්‍රී ලංකාවේ සිතියම් පිළිබඳ සාධිකාරී බලය රාජ්‍ය මිනුම් දෙපාර්තමේන්තුව සතුවේ.

මූලික සිතියම්වලට අමතරව පාඨක අවශ්‍යතා සරිලන පරිදි අයත් කර ගත යුතු අතිරේක සිතියම් ද ඇත. ලෝකයේ රටවල් සිතියම් මගින් විදහා දක්වීම ඇමරිකාවේ රහස් ඔත්තු සේවා සංවිධානය (සී. අයි. ඒ.) මගින් සාර්ථකව කර ඇත. එමගින් ඒ ඒ රටවල ජනගහන ව්‍යාප්තිය, ප්‍රධාන ආගම්, ධාන්‍ය හා සත්ව ගොවිපළවල්, පතල් ආදී කෘෂි සමාජ ආර්ථික සම්බන්ධතාවන් පිළිබඳ තොරතුරු ලබා දේ. උදාහරණ වශයෙන් චීන මහජන සමූහාණ්ඩුවේ පරිපාලන සිතියම, ධ්‍රැව ප්‍රදේශ සිතියම, ඉන්දියානු සමුද්‍ර සිතියම සහ සෝවියට් රුසියාවේ කෘෂිකාර්මික සිතියම දක්විය හැකිය.

සංචාරක ගමන්, විනෝද චාරිකාවලදී ප්‍රයෝජනවත් වන සිතියම් රජයේ විවිධ දෙපාර්තමේන්තු සංස්ථා හා මණ්ඩල මෙන්ම ස්වේච්ඡා සංවිධාන මගින් සම්පාදනය කැරේ. මේ සිතියම් රජයේ මිනුම් දෙපාර්තමේන්තුව, ජනලේඛන හා සංඛ්‍යාලේඛන, ප්‍රවෘත්ති, කෘෂිකර්ම, වන සංරක්ෂණ, වනෝද්‍යාන සහ දෙපාර්තමේන්තු සහ සංචාරක මණ්ඩලය යනාදිය මගින් ප්‍රකාශයට පත්වේ.

සිතියම් එකතුවක ඇති සම්පත් ස්වභාවය පරීක්ෂා කිරීම විමර්ශන සේවාවන්හිදී වැදගත් වේ. මහාමාර්ග හා පරිවහන රථා, සාගර හා ග්‍රාම නිර්මාන රාජ්‍ය මාර්ග සංඥා, භූ නිර්මාන සමීක්ෂණ, ඛනිජ සම්පත් රාශිකරණය, සහ ජල විදුලි සම්පත් යනුවෙන් සිතියම් වල භෞතික සැකැස්ම අනුව වර්ගීකරණය කළ හැකි වේ. එමෙන්ම කලාපීය, ප්‍රාදේශීය හා දිස්ත්‍රික්ක, සම්බන්ධිත සිතියම්, සාගරික වැඩ සටහන් වලට අදාල වන සිතියම් ද දක්නට ඇත. මෙවැනි සිතියම් අයත් කර ගැනීම පහසු කාර්යයක් නොවූවද, ඒ සඳහා කාර්යාල සම්බන්ධතා ඇති කර ගැනීම අත්‍යාවශ්‍ය වනු ඇත.

ප්‍රදේශයක භූගෝලීය විසමතාව නියම අයුරින් විදහා දක්වන ගුවන් ඡායාරූප (Aerial Photographs) භූමියේ ස්වභාවය වෙනස්වීම හා කෘෂි කාර්මික උපයෝගීතාවය තත්ත්වාකාරයෙන් සිතියම්වලට නගා තිබේ. මහජන පුස්තකාලයක අවශ්‍යයෙන්ම සතු විය යුතු ජලග සිතියම් විශේෂය නම් සංචාරක සිතියම් ගොනුවය. (Travel map file) නගර හා රටවල් පිළිබඳ තොරතුරු ඇතුළත් මෙම සිතියම් සමහර විට නොමිලයේ ද අයත් කර ගත හැක. නොමිලයේ සිතියම් ලබා ගත හැකි වුවත් පුස්තකාලය තුළ ඒ සඳහා වෙන්වන ඉඩ ප්‍රමාණය හා යෙදවෙන උපකරණ අනුව වැය කිරීමක් සිදුවන නිසා තේරීම ප්‍රවේශමෙන් හා නැණවත්ව සිදු කළ යුතුය.

අන්තර්ජාතික වශයෙන් රටවල් ආවරණය වන පරිදි සිතියම් එකතුවක් ගොඩනැගීමට අපේක්ෂා කරනුයේ නම් ඒ සඳහා ප්‍රධාන පෙළේ සිතියම් සම්පාදක නාමාවලියක් අත්‍යාවශ්‍යය. (Worldwide Directory of National Earth - Science Agencies and Related International Organization) එමෙන්ම වාණිජ මට්ටමින් සිතියම් නිෂ්පාදනය, බෙදා හැරීම හා අලෙවිය පිළිබඳ තොරතුරු ඇතුළත් වටිනා ග්‍රන්ථයක් ලෙස (Mary Larsgaard) විසින් රචිත (Map Libraianship and Introduction) හැඳින්විය හැකිය. විමර්ශන කාර්යයේදී රටක පිහිටීම හා හැඳින්වීම සඳහා උපකාරී වනුයේ (Websters Geographical Dictionary) කෘතියයි. තවත් මූලික විමර්ශන කෘති වශයෙන් කැපී පෙනෙනුයේ (International geographic Encyclopedia and atlas) සහ සවිස්තරාත්මක (Columbia Lippincalt Gezeteer of the word Commercial

Atlas and Morbeting guide) භූමි දර්ශක නාමාවලීන් සම්පූර්ණ කිරීම සඳහා ලෝක සිතියම් ද තිබීම ප්‍රමාණවත්ය. ලෝක සිතියම් අතුරෙන් (Times Atlas of the world) කැපී පෙනේ.

සිතියම් සුචිකරණය, ග්‍රන්ථ සුචිකරණයට වඩා දුෂ්කරතා ඇති කෙරේ. සිතියමක් එක් පිටුවකට පමණක් සීමාවිය හැකි වුවත් එහි විමර්ශන අගය අති මහත් ය. ඒ නිසා සිතියම් ග්‍රන්ථ විද්‍යාත්මකව සංවිධානය කිරීමේදී බොහෝ විශාල පුස්තකාල සාමාන්‍යයෙන් අනුගමනය කරන ක්‍රියා පිළිවෙළ වනුයේ සිතියම් පිළිබඳ අනුක්‍රමණිකාවක් සකස් කිරීමයි. එමගින් ප්‍රවර්තන අගය මැනවින් රැක ගැනීමට හැකිවේ. කෙසේ නමුත් සිතියම් ප්‍රමාණය අතින් විශාල සංඛ්‍යාවක් ඇත්නම් සුචිකරණය හා වර්ගීකරණය කළ යුතුවේ. සිතියම් සුචිකරණයේ දී ඇන්ග්ලෝ ඇමරිකානු සූචි ව්‍යවස්ථා මාලාවේ දෙවන සංස්කරණයෙහි සවිස්තරාත්මක සුචිකරණ උපදෙස් පිළිපැදීම යෝග්‍ය වන අතර ප්‍රබල විඥාපන ජාල පද්ධතීන් වන OCLC සහ RLIN පවා ඒවා සම්මුතීන් වශයෙන් පිළිගනී.

සිතියම් තැන්පත් කිරීමේ ක්‍රමය එකතුවේ ප්‍රමාණය, ඉඩ ප්‍රමාණය හා උපකරණ අනුව තීරණය වේ. විශේෂිත ආරක්ෂිත සිතියම් ඇසුරුම් ඒකක අවශ්‍ය වනුයේ අවම වශයෙන් 1000 ක් ඉක්මවා යන විටදී ය. මේ සඳහා සකස් කර ඇති Holinger art print ඇසුරුමක සිතියම් 50 – 100 ක් අතර ප්‍රමාණයක් පහසුවෙන් තැන්පත් කළ හැකිවේ. ඒවා පැතලි හා සෘජු ආකාරයෙන් සකස් කර ඇති ගොනු විශේෂයන් ය.

මේ අනුව මහජන පුස්තකාල පාඨක සේවාවේදී සිතියම් පිළිබඳ විඥාපන නිරාවරණය පාඨක අවශ්‍යතා මැනවින් ඉටු කිරීම සඳහා ක්‍රමික සැලැස්මක් මත පදනම් වූ ක්‍රියාවලියක් අත්‍යාවශ්‍ය ය.


නියමිත ප්‍රමිතියට අනුකූලව පිළියෙළ වූ

# පුස්තකාල ලිපිද්‍රව්‍ය හා උපකරණ

| | | | | | |
|---|---|---|---|---|---|
| 01. | පොත් තුණ්ඩු | 100 | — | රු. | 10. 00 |
| 02. | දින පත්‍රිකා | 100 | — | රු. | 10. 00 |
| 03. | පාඨක බලපත්‍ර | 100 | — | රු. | 21. 00 |
| 04. | නියමු ලේබල් (ඉංග්‍රීසි, සිංහල) | 100 | — | රු. | 29. 18 |
| 05. | සූචි පත්‍රිකා | 100 | — | රු. | 15. 00 |

විමසීම,

සභාපති,
ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය,
තැ. පෙ. 1764,
නිදහස් මාවත,
කොළඹ 07.

දුරකතන: 598847
95200

# පුස්තකාලයාධිපතීන් සතු වගකීමක් ගැනයි.

''හැම වැඩිහිටියකු තුළම ළමයෙක් ද, හැම ළමයකු තුළම වැඩිහිටියෙක් ද වෙයි'' යන්න දර්ශනික අදහසකි. අනාගතයේදී පත පොත කියවීමේ යෙදෙන වැඩිහිටියා වන්නේ අද ළමා වියේ පසුවන කුඩා දරුවා ය. වත්මන් වැඩිහිටියන් ළමා පොත පත ගැන සැලකිලිමත් නොවුවහොත්, එයින් දරුවන්ට මෙන්ම වැඩිහිටියන්ට ද බලවත් පාඩුවක් සිදුවේ. දරුවන්ට රස වින්දනයට ඇති වටිනා මාධ්‍යයක් නොලැබී යයි. වැඩිහිටියන්ට ළමා අදහස්වලට සමීප වීමට ඇති ප්‍රධාන මාර්ගයක් ඇහිරී යයි. එපමණක් ද නොවේ. අනාගත වැඩිහිටියන් සාහිත්‍යයට හා ඉගෙනීමට ඇති අභිරුචිය, ආශාව ක්‍රමයෙන් හීනවී යෑමට එය හේතුවක් වනු නො අනුමානය. එහෙයින් වැඩෙන දරුවාගේ මානසික හා සමාජයීය සංවර්ධනයට පත පොත ලබා දීම අත්‍යාවශ්‍යය.

මෙහිලා පුස්තකාලයාධිපතීන් හැටියට ඔබ හැමට කළ හැකි සේවය සුළු පටු නොවේ. තනිවම පොතක් කියවා රස වින්දනයක් ලබා ගැනීමට නොහැකි දරුවාට පිහිට වීමට ඔබට පුළුවන. ඔබ ඒ සඳහා ''කතා පැය උපයෝගී කර ගන්න. 'කතා පැය' සඳහා වෙන් කර ඇති කාලය, උපරිම වශයෙන් ප්‍රයෝජනවත් කර ගැනීමට ළමයාට උදව්වීම ඔබ ගේ යුතුකමකි. ළාබාල වියෙහිදී කතාවක රස විඳින දරුවාත්, එම කතාව කියාදෙන වැඩිහිටියාත් අතර සුහද සම්බන්ධතාවක් ඉබේටම ගොඩ නැගේ. දරුවාගේ සමාජයීය හා මානසික සංවර්ධනයට අවශ්‍ය පදනම දැමීමට මෙහිදී ඔහුට උපකාර විය හැකිය. පියවි ඇසට නො පෙනුණත් කතා රස විඳීම සමගම දරුවාට මානසික ප්‍රබෝධයක් ඇතිවේ. එසේම එමගින් අවධානයෙන් යුතුව සවන් දීමට හුරු වීම, වාග්මාලාව පෝෂණය වීම. ආකල්ප සංවර්ධනය, ආත්ම සංකල්පය හැඩ ගැසීම, බුද්ධි සංවර්ධනය ආදී කාර්යයන් රාශියක් ද නිතැතින් සිදුවේ.

ළමයකු කියවීමෙ පුරුද්දට පුහුණු නොවීම මූලික වශයෙන් ඔහුගේ අධ්‍යාපනය කෙරෙහි ද, දෙවනුව ඔහුගේ රැකියාව, ධනෝපායන මාර්ගය, සමාජ ආශ්‍රය ආදී වශයෙන් සම්පූර්ණ අනාගත ජීවිතය කෙරෙහි ද

# දරුවාට පොතක් තෝරා දීම

මිනිස් ජීවිතයේ ආරම්භය දරුවා නම් සාහිත්‍යයේ ආරම්භය කතාන්තරය යයි කිව හැකිය. කතාන්තර හා මිනිස් ජීවිත අතර ඇත්තේ ගැඹුරු සම්බන්ධතාවකි. දරුවන් හද වඩා ගැනීමේදී කතාන්තර මොන තරම් ස්වාභාවික ලෙස ඔවුන්ට සමීපවේ ද? දරුවාට කතාන්තරයක් කියා දීමට ඕනෑම වයසක වැඩිහිටියකුට පුළුවන. කුඩා අවධියේදී දරුවාට කෑම ටික කවා ගැනීමට, ඔහු නිදි ගැන්වීමට වැඩිහිටියන් විසින් යොදා ගන්නා මෙම උපක්‍රමය – කතාන්තර කීම – දරුවා වැඩෙන විට කෙතෙක් දුරට පවත්වා ගෙන යේද? දෙමව්පියෝ තමදරුවන්ගේ කායික වර්ධනයට අවශ්‍ය ආහාර පාන ඒ ඒ වේලාවට නොවරදවා සපයා දෙති. එහෙත් ඔවුහු ළමයින්ට අවශ්‍ය මානසික ආහාර ගැන සිතා බැලීමට කාලය මිඩංගු කරත්ද? වාණිජ සමාජයේ තරග රැල්ලට හසුව, එදිනෙදා ජීවිත ගැටලුවට ආයාසයෙන් මුහුණ දෙන වත්මන් දෙමව්පියන්ට, තම දරුවන්ගේ අත් දැකීම් පෝෂණයට, බුද්ධි සංවර්ධනයට, රස වින්දනයට ඉවහල් වන කතාන්තර කියාදීමට කාල වේලාවක් සොයා ගැනීම දුෂ්කර කරුණකි. එම ගතානුගතික දයාදය – 'කතාන්තර කීම' - වත්මන් සමාජයෙන ඈත් වි ගොස් ඇත. එය ලබාදීමට ඇති එක මගක් නම් ළමා පොත් ය.

බලපෑමක් ඇති කරයි. පොත පත කියවීමේ පුරුද්දට ළමයා ඇබ්බැහි කරවීමේ වගකීම බෙහෙවින් රැඳී ඇත්තේ වැඩිහිටියන් අත ය. දරුවා කියවීමට පෙළඹෙන්නේ ඔබ ඔහු තුළ කියවීමේ රුචිකත්වය, ආශාව ජනිත කළ තරමට ය. එය කළ යුත්තේ කෙසේ ද?

පොත පත තෝරා ගැනීමට ළමයාට උදවුවීම, මෙහිදී ප්‍රමුඛ ස්ථානයක් ගනියි. ළමා මනස සංවර්ධනය වන්නේ ළමයාට පරිසරයෙන් ඇසෙන, පරිසරයෙන් දකින්නට ලැබෙන දේවල් ඇසුරිනි. ළමා කාලයේදී පරිසරයෙන් උකහා ගන්නා දෑ ඔහුගේ මුළු ජීවිතයටම බලපෑමක් ඇති කෙරේ. එමනිසා ළමයින් සඳහා පොත්පත් තෝරා දීමේදී අප පරික්ෂාකාරී විය යුතුයි. ළමයාට ඔහු වසන සමාජයේ යහතින් ජීවත්වීමට අදාල වන සංකල්ප ගොඩ නගා ගැනීමට ඉවහල්වන පොත පත ලබා දිය යුතුවේ. නිවැරදි ආත්ම සංකල්පයක් ගොඩ නගා ගැනීමට මිනිසුන් හා ජීවිතය හරිහැටි අවබෝධ කර ගැනීමට උසස් ගුණධර්ම වර්ධනයට ළමයා කියවන පොත පත ඔහුට පිහිට විය යුතුයි.

**නන්ද නාරංගොඩ**

**මනෝවිද්‍යාව පිළිබඳ කථිකාචාරිනී,**

**ගුරු විද්‍යාලය, – මහරගම.**

මෙහි දී, ඒ ඒ වයස් මට්ටමේ ළමයින් අතට පත් කළ යුත්තේ කුමන අන්දමේ පොත් වර්ග ද යන්න ගැන ඔබට හොඳ අවබෝධයක් තිබීම වැදගත් වේ. ඉතා කුඩා අවධියේ දී වුවත් පොත පත දකින්න, බලන්න, අත ගාන්න, අවස්ථාවක් ලැබීම, ළමයකුට පොත් පත් කියවීමට පෙළඹවීමක් ඇති කරවන්නකි. ඒ සඳහා ඉඩ කඩ සැලසීම අවශ්‍යයි. අලුතින් ලැබෙන පොත ළමා ඇස ගැසෙන සේ ප්‍රදර්ශනය කිරීම, පොත් වල දර්ශනීය පිට කවර ප්‍රදර්ශනය කිරීම, අවුරුද්දකට වරක් හෝ පොත් ප්‍රදර්ශනයක් පැවැත්වීමට කටයුතු සංවිධානය කිරීම ආදී ක්‍රියා මාර්ග මගින් කියවීම කෙරෙහි ළමයින් උනන්දු කළ හැකි ය. අවුරුදු 2 – 6 වයස් සීමාවේ පසුවන දරුවන්ට වඩාත් සුදුසු වන්නේ 'පින්තූර කතා පොත්' ය. පින්තූරවල කතාවක් ගැබ්ව තිබීම, පින්තූර වැඩියෙන් සහ වචන අඩුවෙන් තිබීම සුදුසු වේ. අන්‍යයන් අනුකරණයෙන් හා සංසන්දනයෙන් තමා අවබෝධ කර ගැනීමට මේ වයසේ ළමයා උත්සාහ දරයි. ක්‍රමයෙන් වැඩෙන්ම අනුකරණය අත්හරින ළමයා හිතට කා වැදුණු චරිතාංග තමාගේ පෞරුෂයට සම්බන්ධ කර ගනියි. එමනිසා මේ අවධියේදී, පහත් පෙළේ චිත්‍ර කථා ළමා ඇස ගැසීම පෞරුෂයට අහිතකර ය. අවුරුදු 7 – 9 සාමාන්‍යයෙන් ළමයකු විසින් විසින් කියවීම ආරම්භ කරන වයස් සීමාවයි. එක් සිද්ධියක් ගැබ්වුණු ඒ ඒ තැනට චිත්‍ර යෙදුණු, සරල 'කතා පොඩි', කියවීම ආරම්භ කරන මේ අයට සුදුසු වේ. මේ පොත්, හැඟීම් ජනිත කරවන ඒවා වුවහොත්, ළමයාට සිනාසීමට, ප්‍රීතිවීමට ඒවායින් ඉඩකඩ ලැබුණොත්, ඔහුට කියවීම ප්‍රිය ජනක කාර්යයක් වේ. මෙම සරල 'කථා පොඩි' ළමා ලෝකය හා බැඳුණු ඒවා වීම වැදගත් වේ. මුලදී මෙම පොත් වැඩිහිටියකු විසින් ශබ්ද නගා කියවීමෙන් ළමයාට එය රස විඳීමට ඉඩ සැලසේ. එවිට ළමයා ක්‍රමයෙන් කියවීමේ කුසලතාව පහසුවෙන් අත් පත් කර ගනියි. 'කතා පැයේදී ළමයින්ට කතාන්තර කියා දීම සඳහා විවිධ උපක්‍රම යොදා ගැනීමට ඔබ සමත් විය යුතුයි. ළමයාගේ රුචිකත්වය දියුණු කළ හැක්කේ ඒ අන්දමිනි. කට හඬ උචිත ලෙස උස් පහත් කරමින්, හැඟීමෙන් යුතුව අභිනවයෙන් එක් එක් සිද්ධි දක්වීමෙන්, කථාවේ එයා චරිත වලට සජීවී බවක් ලැබේ. කතාවක් කියා දුන් පසු එය රඟ දක්වීමට පුහුණු කිරීම ද තවත් මාධ්‍යයකි. ඒ ඒ චරිත—විශේෂයෙන් සතුන් හා සම්බන්ධ කතාන්තර කීම සඳහා විශේෂයෙන් 'රූකඩ' උපයෝගී කර ගත හැකිය. ජර්මනියේ මියුනික් නගරයේ පිහිටි ජාත්‍යන්තර පුස්තකාලය අවට ඇති පාසල්වල ශිෂ්‍ය ශිෂ්‍යාවන් 'කතා පැයට' සම්බන්ධ වන ආකාරය මෙහිදී සිහියට නැගේ. ඒ ළමයි 'කථා පැයට' ඉතා කැමැත්තක් හා උනන්දුවක් දක්වති. ඒ ඒ වයස් මට්ටම්වල ශිෂ්‍යයන් සඳහා, ඉතා ක්‍රමානුකූල ලෙස කතා පැය එහි සංවිධානය කර තිබේ. එම පුස්තකාලයෙහි ඇත්තේ පුදුම ක්‍රියාශීලීභාවයකි.

තනිව පොත් කියවා රස විඳීමට පුරුදු පුහුණුවූ ළමයා විවිධ මාදිලියේ පොත් කියවීමට පෙළඹේ. අවුරුදු 10 – 13 වයස් මට්ටමේ ළමයි ප්‍රීති ජනක දේවල් මෙන් ම ශෝක ජනක දේවල් ද, මනඃකල්පිත දේ මෙන්ම තාත්වික දේ හා සම්බන්ධ වූ කථා ද කියවීමට ආශා කරත්, අලුත් දැනීම ලබා ගැනීමට විශේෂ කුතුහලයක් දක්වති. ගැමිකතා, විස්මය දනවන කතා, අද්භූත කතා මෙන්ම විදේශ තොරතුරු කියවීමට ද අලුත් අත්දැකීම් ලැබීමටද ළමයි උනන්දු වෙති. ප්‍රබන්ධ ස්වරූපයෙන් ඇති විවිධ වර්ගයේ කෙටිකතා, කියවා ළමා ලෝකය පුළුල් කර ගැනීමට ඔහුට අත දීමට ඔබ සමත් විය යුතුයි.

වැඩිහිටි වියට පා තබන ළමයාට, උසස් රුචිකත්වයක් වර්ධනය කර ගැනීමට මග පෙන්වීම, විචාරාත්මකව කියවීමට යොමු කිරීම හා නව නිර්මාණ බිහි කිරීමට අත හිත දීම ඔබ විසින් කළයුතු කාර්යයකි. ඒ සඳහා උපයෝගී කර ගත හැකි එක ක්‍රමයක් නම් පොත් සමීක්ෂණය යි. ඔබ පළමුවෙන් පොත හොඳින් කියවා සිසුන් සමග එකතු වී පොතක විවිධ අංශ වලට (උදා : සිද්ධි ගැළපීම, චරිත නිරූපනය ආදි වශයෙන්) අවධානය යොමු වන පරිදි පොතක් සමීක්ෂණය කළ හැකිය. එසේම විවිධ කර්තෘන් ගේ කෘති එකතු කර සිසුන් සමග 'ග්‍රන්ථ සම්මන්ත්‍රණයක්' පැවැත්වීම ද මෙහි ලා වැදගත් වේ. කියවීමේ රුචිය වර්ධනයට මෙන්ම, නව නිර්මාණ බිහි කිරීමේ සමත් උසස් ලේඛකයන් බිහි වීමට ද එය මග පෙන්වනු ඇත.

මේ අනුව බලන විට විවිධ මට්ටම්වල දරුවන් අතට පොත පත ලබා දීමේදී පුස්තකාලයාධිපති හැටියට ඔබ ඉටු කරන්නේ වගකිව යුතු ඉතා වැදගත් කාර්ය භාරයකි.

# SLNLSB and the Public

The Ceylon National Library Services Board was established in 1970 by an act of Paliament. In the act it has been clearly stated that the responsibility of the board towards the Public Library sector is "to advise and assist in the promotion and development of Public Libraries". This act is a result, of the 'meeting of experts on the National Planning of Library Services in Asia', which was sponsored by UNESCO and held in Colombo in December 1967.

In the final report of the meeting the 'experts' discussed the status of libraries in Asia and suggested a 'long term library development plan for Asia'. Besides this, they selected Sri Lanka (then Ceylon) and proposed 'a Library Plan for Ceylon'. In it they suggested creating a 'small high powered body' called the 'Ceylon National Library Services Board'. They intended to create a Library Board with adequate powers to deal with the obstacles, which it would face in creating a National Library Services for the country.

Prior to the 1967 meeting another UNESCO Library Seminar was held in Delhi, India in 1955. This is referred to as the 'Seminar on Public Libraries for Asia' or 'Delhi Seminar'. This was the first international meeting on this subject to be held in an Asian country. Therefore the recommendations of the seminar has had long lasting effects on the Asian Public Library Scene. Sri Lanka was represented at this seminar by an eminent librarian the late Mr. D. C. G. Abeywickrama, then the Colombo Public Librarian. The final report of the seminar recommended the creation of independent Library boards. It states "In a smaller or unitary state one central (Library) authority should suffice. Legislation should provide for a central library board which should be a statutory and autonomous body responsible to a minister, normally the Minister of Education and vested with powers to develop the Public Library Service and allocate grants for Library purposes'. The report also states "In a small or unitary state it might be desirable to create a single board with wide powers of control".

I have quoted both seminar reports to show that the creators of the Ceylon National Library Services Board did not live up to the expectations of these professional view points. Instead of creating a high powered library authority, they established the present board with powers only to 'advise and assist'. This in my view was a costly mistake.

With this background note, I would like to mention the major contributions of the board towards the public library field during the last 16 years. One still finds the contributions of the board remarkable, but it would definitely have been better, had the board been given adequate powers as proposed at the seminars mentioned above.


**By**

**Upali Amarasiri**

**Deputy Director, Sri Lanka National Library Services Board**


During the last 16 years the board has under taken a number of projects for the upliftment of the Public Library Services of the country.

Kandy district rural Library Project
District Central Library Project
Public Library Legislation Project
Book Development Project
Education and Training for Public Librarians
Development Aids for Public Libraries are some of them.

## Kandy District Rural Library Project

The Kandy District Rural Library project 1972-75, was initiated at the 1967 Unesco expert meeting held in Colombo. This project was to be conducted as a pilot project for the whole Asian

# rary Services in Sri Lanka

region. The aim of the project was to improve the rural libraries and rural library services in the Kandy district.

The board implemented the project with assistance from the Unesco, the Department of Local Government and the Kandy Pesantry Commission. The Library Board set up a regional office in Kandy to supervise the project. A number of activities were carried out to improve the standard of libraries in the area under the programme.

A large number of new library buildings were constructed and a number of existing library buildings were repaired. Reader surveys and User education programmes were carried out to popularise the libraries. Public meetings, discussions, seminars, talks, propaganda litrature and other types of propaganda activities were carried out to popularise the library service. All the libraries included in the project, carefully monitored the results of the propaganda drive and remedial measures were taken where necessary.

Regular training courses, workshops, in service training programmes etc. were organised for the librarians. Professional staff of the board made regular visits to the libraries for supervision and professional guidence. The library collections were strengthened and scientifically organised. Librarians were encouraged to carry out extention activities. A number of community centers were attached to a public library, and these centers received books regularly from the library. This solved the problem of library facilities for remote areas of the district. The regional office of the board also started a book loan service for small libraries. Under this programme consignments of new books were sent out to the libraries periodically as loan collections.

The Kandy library project was a succes in many ways. At the end of the project there were well functioning 22 public libraries and 21 school libraries with a large reading publie in the district. According to a survey carried out by the Library Board in 1986, the Kandy District still has the best public library service in the country. The other success is that it provided valuable experience to the library board. It helped the board to understand the various difficulties faced by rural libraries. The solutions found for these problems of the projects have influenced the development of a strategy which has been used by the board ever since.

## District Central Library Project

The District Central Library Project which commenced in 1981 is considered to be the second major project undertaken by the board in the Public Library field. The experience of the Kandy Pilot Project as well as the experiences of other countries with well developed Public Library Services have shown that regional level planning is of vital importance in the development of Public Library Services. The rationale behind this is that instead of isolated small libraries it is advantageous to have a single library net work in the dirtrict with the District Central Library in the centre.

The Library Services Board with the assitance of the Department of Local Government has identified the central libraries in all the districts. A number of conferences, workshops and seminars have been organized by the board to create an awareness of the project among Librarians, Local Government officials, Local Government representatives and officials of other relevant sectors. Special book collections were developed in these district libraries as loan collections for the other libraries in the district. The Open University uses the District Library system, for the benefit of their students scattered all over the country.

The district library project has not yielded expected results due to a number of reasons. The main drawback was that it was not backed by adequate legislation to ensure that it becomes a success. Although in theory all the parties agreed that it was an excellent project in practice Librarians had to face a number of difficulties. For instance Municipal or Urban Council librarians find it difficult to send their library material out side of the local authority. Lack of staff was the other problem. Even after becoming central libraries they were not able to obtain any extra staff though their work load had increased.

The District Library project brought benificial results in many ways. This was the first project conducted on a national scale in Sri Lanka for reorganising the public library services in keeping with modern trends. Thus it created an awareness among local authorities, local government officials, librarians and to an extent among the general public with regard to modern public librarianship. This awareness will be a great assest for the future development of the public library service in Sri Lanka.

The experiment also brought to surface many difficulties in the field hitherto unknown to the authorities. The importance of proper public library legislation, regular financial avenues, public library standards, constant supervision and a number of other important issues required for a well organised public library service have been brought to the notice of the authorities by this project. Most of the District Libraries still function in a limited way. Even with its numerous weaknesses, the district library project has made a long lasting impact on the public library sector in Sri Lanka.

## Public Library Legislation Project

One strange feature of local government legislation in Sri Lanka is that nothing has been mentioned regarding library services in local authorities. In the period between the Municipal Council act of 1861 and Pradeshiya Mandala Act of 1987 about ten major local government legislations have been introduced in Sri Lanka. These legislation cover almost every aspect of local government, except library service.

The non existance of library legislation has been identified as the root cause for the poor public library service in the country. A Committee was appointed by the library board in mid 1986 for the formulation of suitable legislation for public libraries. It comprises representatives from the National Library Services Board, Sri Lanka Library Association, Ministries of Local government and Public Administration, Dept. of Legal Draftsman, and librarians of Colombo and Kandy public libraries.

It is rather early at this stage to discuss the features of the proposed legislation. The work of the committee is almost completed and the draft legislation will be submitted to the government soon. This legislation if succesfully implemented will be the turning point of the public library service in the country. The Committee has concentrated on the major deficiencies of the public library service in the past. Therefore the priorities will be making the library service an obligatory service of the local authorities, regular financial avenues for libraries from both central and local governments, proper planning and supervision etc. The district library system also will be rejuvanated.

Besides these three major projects a number of other activities of the board help the public library sector in various ways.

## Book Development Project

The ailing publishing industry and the paucity of reading material have become major threats to the Public Library movement in third world countries. The scarcity of reading material in vernacular languages make the public library service rather meaningless. This situation has been evident in Sri Lanka too. According to a recent survey done by the Sri Lanka National Library Services Board more than 70% of the book shops in Sri Lanka were closed in the 1970's and the remaining book sellers had to diversify their trade and were compelled to sell other consumer items for survival. There are a number of direct and indirect reasons for this situation which are not discussed here.

Although the act gave a certain responsibility to the board with regard to the book industry this was never a priority of the board due to a number of reasons. Development of libraries was the major responsibility of the board. There was a great deal to be done in this sphere. Also there were a number of government and non government organisations such as the Department of Cultural Affairs, Book Development Council, Book Sellers Association etc. with direct responsibility towards the book industry. By the early 1980's it became clear that all other organisations were not very succesful in responding to this challange. This affected the Library field, especially the Public Library field disastrously. The Board had to intervene at this juncture and the book development scheme is the result of this interven tion.

The book development project started in mid 1984 and is now approaching the fourth year. Under the project the board assists the author / publisher up to a maximum of Rs. 25000/- for publishing a book. In the first year the board allocated a sum of Rs. 2. million and Rs. 2.5, million annually thereafter. At the end of 1987 the total allocation was Rs. 6. 5 million. By the end of 1987, 390 new books were published under the project. All manuscripts considered for assistance under the project

are scrutinised by a panel of specialists and only works of a high standard are approved.

## Education / Training

The board conducts continuing education programmes for the public librarians in the country. The duration of programmes vary from three to five days and have three different levels. 250 to 300 public librarians and library assistants participate in these courses annually. The postal Correspondence course in library science conducted by the board too is very useful to the public librarians. This is a 18 month course which is aimed at librarians who are in remote areas without formal library qualifications.

A considerable number of professional publications have been published by the board. 'The Sri Lanka National Bibliography' and the 'Library News' are the two regular publications of the board.

## Development Aids

The board provides various assistance to selected public libraries annually. It varies from book donations to supplying furniture and equipment to a library. Rs. 50,000 worth of assistance is the upper limit of the present assistance scheme.

All the books published under the book development project are sold to libraries at a special concessionary price. Generally prices of these books are 30% to 50% less than in the open market.

'The book loan project' of the SLNLSB supplies books for small public libraries in selected districts. 'The Universal Availabiity of Publications project,' 'District library survey project,' Library Exhibitions, Professional Advisory services are some of the other activitie of the board which benefit to the public library sector in the country.

## Reference


1. Public Libraries for Asia-The Delhi Seminar, Unesco Public Library manual 7. Paris, Unesco, 1956.
2. Meeting of experts on the National Planning of Library Services in Asia. (11-19th Dec. 1967) Final Report. Paris; Unesco, 1968.
3. Excerpts from the report of the Chairman CNLSB for the year 1973. Library News, 2 (1), March 1974.
4. Panditaratna, K. L. Libraries in the book distribution system with special reference to rural areas. Library News, 5 (3)



# COLLECTION OF BOOKS FOR THE SRI LANKA NATIONAL LIBRARY

Sri Lanka National Library Services Board (SLNLSB) has started collecting materials for deposit in the National Library of Sri Lanka which is to be opened shortly.

The Board would be grateful for any gifts, donation of books, periodicals and other documents relevant to Sri Lanka for deposit in the National Library.

Books weeded out from libraries may also be transported to the National Library for deposit in its repositories which will be made available for reference in the event of such a need arising.

Librarians please contact the Director or if you have unwanted publications.

P. O. Box 1764,
Independence Avenue,
Colombo 7.
Telephone : 598847
95200 - 2

**CHAIRMAN**
Sri Lanka National Library Services Board.

# පුස්තකාල විද්‍යාර්ථීන් ගේ
# දැනුම වඩන ප්‍රකාශන පෙළක්

| | | |
|---|---|---|
| 1. | පුස්තකාල බලය (පරිවර්තනයකි) – ජේම්ස් තොම්සන් | 38. 50 |
| 2. | නව තොරතුරු මාධ්‍ය සහ පාසල් පුස්තකාල – උපාලි අමරසිරි | 30. 00 |
| 3. | කුඩා කාර්මික ආයතන පුස්තකාල (පරිවර්තනයකි) – ඩී. ජේ. කැම්බල් | 31. 00 |
| 4. | මූලික සූචිකරණය – ධනපාල ගුණසේකර | 37. 00 |
| 5. | ඌවේ ජනකවි – පීටර් විජේසිංහ | 15. 00 |
| 6. | මහජන පුස්තකාල ප්‍රමිති | 4. 00 |
| 7. | පුස්තකාල ප්‍රවෘත්ති (ත්‍රෛමාසික) වාර්ෂික | 20. 00 |
| 8. | ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය (ත්‍රෛමාසික) වාර්ෂික | 80. 00 |
| 9. | කාර්මික විද්‍යාල පුස්තකාල තොරතුරු සංග්‍රහය – උපාලි අමරසිරි | |
| 10. | **Catalogue of Post Graduate Theses – N. Amarasinghe** | 74. 00 |
| 11. | **Directory of Technical College Libraries – Upali Amarasiri** | |

මුදල් හෝ තැපැල් ඇණවුම්, චෙක්පත් – සභාපති, ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය නමට ලියනු මැනවි.

විමසීම් හා ලිපි :

සභාපති,
**ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය,**
තැ. පෙ. 1764 නිදහස් මාවත. කොළඹ 07. ටෙලි. 598847

# දේශීය පුස්තකාල හා විඥාපන විද්‍යා පාඨමාලා සහතික පත්‍ර

දේශීය පුස්තකාල හා විඥාපන විද්‍යා පාඨමාලාවන් සහ ඒවා විවිධ ශ්‍රේණි වලට බෙදෙන ආකාරය පිළිබඳ තොරතුරු පහත දක්වේ. පුස්තකාලයාධිපතීන් බඳවා ගන්නා සම්මුඛ පරීක්ෂණවලදී මතුවන ගැටලු සහගත තත්වයන් පිළිබඳ පුස්තකාල සේවා මණ්ඩලයට ලැබී ඇති තොරතුරු නිසා මේ පිළිබඳ උනන්දුවක් දක්වන අයගේ යහපත තකා මෙය පළ කෙරේ.

| | |
|---|---|
| ප්‍රථම ශ්‍රේණිය | 1. පුස්තකාල හා විඥාපන විද්‍යා පශ්චාත් උපාධි ඩිප්ලෝමාව කැලණිය විශ්ව විද්‍යාලය.<br>2. පුස්තකාල හා විඥාපන විද්‍යා පශ්චාත් උපාධි ඩිප්ලෝමාව පේරාදෙණිය විශ්ව විද්‍යාලය (1962 — 1965) |
| දෙවන ශ්‍රේණිය | 1. ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ පුස්තකාල හා විඥාපන විද්‍යාව පිළිබඳ අවසාන පරීක්ෂණ සහතිකය.<br>2. කැලණිය විශ්ව විද්‍යාලයේ පුස්තකාල විද්‍යාවේදී උපාධිය.<br>3. කැලණිය විශ්ව විද්‍යාලයේ පුස්තකාල විද්‍යා හා ප්‍රලේඛන සේවා වෘත්තීය උසස් සහතික පත්‍රය. |
| තෙවන ශ්‍රේණිය | 1. ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ පුස්තකාල හා විඥාපන විද්‍යාව පිළිබඳ මධ්‍ය පරීක්ෂණ සහතිකය.<br>2. කැලණිය විශ්ව විද්‍යාලයේ පුස්තකාල විද්‍යා විෂය සහිත ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධිය.<br>3. කැලණිය විශ්ව විද්‍යාලයේ පුස්තකාල විද්‍යා හා ප්‍රලේඛන සේවා සහතික පත්‍ර පරීක්ෂණයේ දෙවන පරීක්ෂණ සහතිකය.<br>4. කණිෂ්ඨ විශ්ව විද්‍යාල පුස්තකාල හා විඥාපන විද්‍යා ඩිප්ලෝමා සහතිකය (1968 — 1970) |
| සිව්වන ශ්‍රේණිය | 1. ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ පුස්තකාල හා විඥාපන විද්‍යාව පිළිබඳ ප්‍රථම පරීක්ෂණ සහතිකය.<br>2. කැලණිය විශ්ව විද්‍යාලයේ පුස්තකාල විද්‍යා හා ප්‍රලේඛන සේවා සහතික පත්‍ර පරීක්ෂණයේ ප්‍රථම පරීක්ෂණ සහතිකය.<br>3. ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ පුස්තකාල විද්‍යා, ප්‍රලේඛන හා විඥාපන විද්‍යාව පිළිබඳ තැපැල් මාර්ගික පාඨමාලා සහතිකය. |

# ජාතික පුස්තකාලය සම්ප්‍රදායය හා වෙනස

ජාතික පුස්තකාල මහත් විවිධත්වයක් දක්වයි. කාර්මික රටවල 18 වන හා 19 වන සියවස්වල මුල් භාගයට සම්බන්ධ ඒවා හා තුන්වන ලෝකයට අයත් වූ ද, දෙවන ලෝක යුද්ධයට පසු පිහිටුවන ලද පුස්තකාල අතර සමාන ලක්ෂණ ඇත්තේ සුළු වශයෙනි. එසේ වුවද සියල්ලන් විසින් පිළිගනු ලබන සම්ප්‍රදායික කාර්යයක් ඇත, එය ජාතියේ හා ඉතිහාසයේ උරුමය කියාපාන ග්‍රන්ථාරූඪ ඥාන සම්භාරය ඇතුළත් ග්‍රන්ථ සමූහයයි.

ඇත්ත වශයෙන්, දැන් මෙම සම්ප්‍රදායික කාර්යය සම්පූර්ණ වශයෙන් ඉටු වන්නේ කලාතුරකිනි. එය එසේ වන්නේ ග්‍රන්ථාරූඪ ඥානය පිළිබඳ ස්වරූපවල විෂය පළල් වී ඇති බැවිනි. චිත්‍රපට, වීඩියෝ පටි සහ පටිගත කරන ලද හඬවල්, මුද්‍රිත ග්‍රන්ථ මෙන් ම දැන් බහුලව ඇත. කිසිම මුද්‍රිත ස්වරූපයකින් පළ නොකරනු ලබන ඉලෙක්ට්‍රෝනික පාඨ ග්‍රන්ථ දැන් පළ කරනු ලැබේ, වචන පිරිසැකසුම් ක්‍රම හා ලාභ ප්‍රතිරූප ක්‍රම නිසා බොහෝ ග්‍රන්ථ කර්තෘවරුන්ට දැන් තමන්ගේ ම ප්‍රකාශකයන් විය හැකිය. සාමාන්‍යයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන ග්‍රන්ථ හා ශාස්ත්‍රීය සඟරා මෙන් ම ජාතික උරුමයේ කොටසක් වන ලිපිලේඛන ඇතුළත් මේ සියලුම වර්ග කිසිසේත් නීතියෙන් ආරක්ෂා නොවේ. එය එසේ වුවද එය සම්පූර්ණයෙන් ක්‍රියාත්මක නොවේ.

ජාතික ප්‍රකාශන එකතුව සම්පූර්ණ වීමට නම් ජාතික පුස්තකාලය අලුත් පොත්පත් ලබාගත යුතුයි. එසේ කිරීමට නම් පුස්තකාලයට චිත්‍රපට පෙන්වීමට උපකරණ තිබිය යුතුය. වීඩියෝ පටි හා පටිගත කරන ලද හඬවල් ක්‍රියා කරවීම හා ඉලෙක්ට්‍රෝනික මගින් රුස්කරන ලද ග්‍රන්ථ ලබාගැනීමට අවකාශ ලබා දිය යුතුය. ඒවායේ සම්ප්‍රදායානුකූල කාර්යය ඉටු කිරීම සඳහා ජාතික පුස්තකාලවලට විශාල වෙනස් කම් අවශ්‍ය වේ,

ජාතික ප්‍රකාශන රුස් කිරීමේ වග කීම සමග ඒවා ආරක්ෂා කිරීම හා ඒවා පාඨකයන් වෙත ලබා දීමේ වගකීමද එකට යා යුතුයි. මේ ප්‍රශ්නයේ ප්‍රමාණය හඳුනාගෙන ඇත්තේ මෑතකදීය, 1830 ට පසුව නිපදවන ලද කරදසි බොහොමයක් විනාශවන සුලුය. එම ද්‍රව්‍යය ක්ෂුද්‍රස්වරූපයට හෝ ඉලෙක්ට්‍රෝනික ස්වරූපයට හැරවීමට හෝ ඒවායේ අම්ලය නැති කිරීමට හෝ පිළියම් කිරීම සඳහා මුදල් අධික ලෙස වියදම් වෙයි. පටල බොහෝ වශයෙන් තනා ඇත්තේ විනාශ වන සුළු ද්‍රව්‍යයන්හි ය, (නයිට්‍රේට්) ඇතැම් ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය යල්පැනපු තත්වයට පැමිණෙන බැවින්, මේ යල්පැනපු උපකරණ ක්‍රියා කරවීම සඳහා ඒවා ක්‍රියාකාරී තත්වයක තබා ගතයුතුය. එසේ නැත්නම් ඒවා නව මාධ්‍ය ලෙස වෙනස් කළ යුතුය. ඉලෙක්ට්‍රෝනික් පාඨයක් විවිධ ස්වරූපවලින් දැක්විය හැකිය. එවිට එය සමාන ප්‍රශ්න ඇති කරයි. එයට නොයෙක් මෘදු භාණ්ඩ අවශ්‍ය වන අතර ඒවාද වෙනස් විය හැකිය.

**මොරිස් ලයින්**

අධ්‍යක්ෂ ජනරාල්, විද්‍යාව හා තාක්ෂණ අංශය,
බ්‍රිතාන්‍ය ජාතික පුස්තකාලය.

ජාතික පුස්තකාලයට ගෙනෙන ලද වෙනත් රටවල පළකරනලද වටිනා ලිපිලේඛන පිළිබඳවද මේ වගකීම් දැරිය යුතු යි.

ලේඛනගත දැනුමේ විවිධ ස්වරූප වැඩිවීම නිසා ඒවා රුස්කිරීම හා සුරක්ෂිත කිරීමේ වගකීම විවිධ මණ්ඩල අතර බෙදාගත හැකිය. මුද්‍රිත ලිපි ලේඛන සඳහා ජාතික පුස්තකාලයද, ජාතික චිත්‍රපට පුරාලේඛනාගාරයක් ද නිදසුන් වශයෙන් දැක්විය හැකිය. මේ අතින්, සම්බන්ධීකරණය සුදුසු වෙයි.

ජාතික පුස්තකාලයකට අයත් වන වෙනත් වගකීම් බොහොමයක් ඇත. එහෙත් ජාතික පුස්තකාලයක් හා තොරතුරු පද්ධතියක් ඉටු කළ යුතු කාර්යයන් ද ඒවා ඉටු කිරීමේදී ජාතික පුස්තකාලය ඉසිලිය යුතු කොටස කුමක්දැයි (රුස්කිරීම හා සුරක්ෂිත කිරීමේදී මෙන්) සලකා බැලීමද වඩාත් ප්‍රයෝජනවත් වෙයි.

ජාතික පුස්තකාලයක ප්‍රධාන කාර්යයක් වන්නේ ජාතික ප්‍රකාශනවල නාමාවලිය පාලනය කිරීමයි. ඒවා ලේඛනගත කිරීම හා ඒවා මුද්‍රණය කොට, (සම්මත පරිගණක සටහන් වශයෙන් නම් වඩාත් සුදුසුය.) එම ලේඛන පාඨකයන් වෙත ලබාදීමට සැලැස්වීමයි. (මෙය සමස්ත ග්‍රන්ථ නාමාවලි පාලන-යට අයත් වගකීමකි) ග්‍රන්ථ නාමාවලි පාලනයට සියලුම වර්ගයේ ජාතික ප්‍රකාශන ඇතුලත් විය යුතු අතර එහි වගකීම දැරිය යුත්තේ එම ලිපි ලේඛන රැස්කරන මණ්ඩලයයි.

මේ සමග ම ලෝක සාහිත්‍යය පිළිබඳ ග්‍රන්ථ නාමාවලිය මුද්‍රිත ස්වරූපයෙන් හා පරිගණක ස්වරූප යෙන් ලබාදිය යුතුයි. පළකරන ලද ග්‍රන්ථ නාමාවලී, ශාස්ත්‍රීය සඟරා සූචිකරණය හා සංක්ෂිප්ත කරණය හා ග්‍රන්ථ නාමාවලි දත්තයන් මගින් ප්‍රාදේශීය පුස්තකාල විසින් මෙම සේවය සාමාන්‍යයෙන් සපයනු ලැබේ. එහෙත් ජාතික මට්ටමකින් මේ සඳහා ආධාර අවශ්‍ය විය හැකිය.

තවත් ප්‍රධාන ජාතික කාර්යයක් වන්නේ ලිපි ලේඛනවලට ළඟාවීමට සැලැස්වීමයි. එය නොමැතිව ග්‍රන්ථ නාමාවලි පාලනය නිෂ්ඵල ය. පුස්තකාලයේ තොග ගොඩේ තිබෙන ප්‍රකාශන බලා ගැනීමට කැමැති පාඨකයන්ට එසේ කිරීමට අවකාශ ලබා දිය යුතුයි. ජාතියේ සිය නිෂ්පාදනවල පිටපත් හා ඡායා රූප පිටපත් දුරස්ථ පාඨකයන්ට ලබා දිය හැකි වන්නේ අතිරේක පිටපත් තැන්පත් කිරීමෙන් ය. වෙනත් ප්‍රකාශනවලට ළඟා වීම විවිධ මාර්ගවලින් කළ හැකිය. තනි සර්ව සම්පූර්ණ ජාතික එකතුවක් ඇති කිරීමෙන් හා ජාතික පුස්තකාලයක් විසින් පාලනය කරනු ලබන ග්‍රන්ථ නාමාවලියක් සහිත සම්පූර්ණයෙන් විමධ්‍ය ගත කිරීමෙන් මෙය කළ හැකිය. මීට හොඳම විසඳුම වන්නේ වැඩියෙන් ම භාවිතා වන ශාස්ත්‍රීය සඟරාවල සීමිත මධ්‍ය එකතුවක් හා වෙනත් පුස්තකාලවල ග්‍රන්ථ ලබා ගැනීම සඳහා විමධ්‍යගත අවකාශ ලබාදීමයි. පුස්තකාලවලට අවශ්‍ය ග්‍රන්ථ ලබා ගැනීම සහතික කිරීම සඳහා ජාතික පරිග්‍රහණ ප්‍රතිපත්තියක් අතිශයින්ම අවශ්‍ය ය.

එක් එක් පුස්තකාලයකට වැඩිදුරටත් අවශ්‍ය නොවන ග්‍රන්ථ රටට නැති නොවන පරිදි සහතික කිරීම පිණිස ජාතික සංචිත වැඩ සටහනක් ද අවශ්‍ය වේ. මෙය ජාතික ග්‍රන්ථ ලබාගැනීමේ වැඩසටහනට සම්බන්ධ කළ යුතුයි. ලේඛන සැපයීම, ලබාගැනීම හා තබාගැනීම යන මේ කරුණු තුනම සම්පූර්ණ ජාතික සැපයීම හා ලබා ගැනීම පිළිබඳ සැලසුමක් ලෙස සැලසුම් කළ යුතුයි.

ඉහත සඳහන් දෑ ජාතික කාර්යයන් ලෙස සලකනු ලැබේ. සැලසුම් කිරීමේදී වත් ජාතික පුස්තකාලය ප්‍රධාන ප්‍රායෝගික කාර්යයක යෙදිය යුතු ය. ජාතික පුස්තකාලයට ඉටු කළ හැකි වෙනත් කාර්යයන් ද ඇත. ඒවා නම්

පුස්තකාල හා තොරතුරු අභ්‍යාස පිළිබඳ පර්යේෂණ

අභ්‍යාස ලාභීන්ගේ අධ්‍යාපනය හා පළපුරුදු පුස්තකාලයාධිපති වරුන්ගේ අධ්‍යාපනය වැඩි දුරටත් පවත්වාගෙන යාම

සැලසුම් කිරීමෙන් හා ආදර්ශයෙන් ජාතියේ පුස්තකාලවල නායකත්වය

වඩා අලුත් හා ඉතා වැදගත් කාර්යයක් ඇත: තොරතුරු සේවා සැපයීම, පාඨකයන්ට හා දුරස්ථ පාඨකයන්ට විශේෂ මාතෘකා යටතේ ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලි සැපයීම මීට ඇතුලත්ය. එහෙත් එය මීට වඩා එහාට යයි. ඕනෑම පුස්තකාලයකින් සැපයීමට බලාපොරොත්තු විය හැකි මූලික ආශ්‍රිත ග්‍රන්ථ සේවයට වඩා යමක්, එනම් එක් එක් සංවිධානයකට හා පාඨකයන්ට තොරතුරු සැපයීම සංවිධානවලට හා පාඨකයන්ට අවශ්‍ය වන්නේ ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලි හෝ ලේඛන නොව තොරතුරුය. ඇතැමෙකුට මේවා ඒ ඒ ග්‍රන්ථවලින් උපුටා සකස් කොට දැක්විය යුතුයි. ජාතික සංවර්ධනය සඳහා මෙය වැදගත් කාර්යයකි. විද්‍යාව, තාක්ෂණ විද්‍යාව, වෛද්‍ය විද්‍යාව හා කෘෂිකර්මයට මෙය විශේෂයෙන් අදාල වෙයි.

තොරතුරු සැපයීම පිළිබඳව ඒවා කළ යුතු කාර්යය කුමක් දැයි ජාතික පුස්තකාල කල්පනා කළ යුතුයි. ඒවා බොහොමයකට විද්‍යාත්මක හා තාක්ෂණ කරුණු ඇතුලත් විශාල සම්පත් ඇත. ඇතැම් රටවල ජාතික පුස්තකාල පමණක් නොව ඊට අමතරව ජාතික ප්‍රලේඛන මධ්‍යස්ථාන ද ඇත. විද්‍යාත්මක හා තාක්ෂණ තොරතුරු සේවයක් තිබීමෙන් ප්‍රශ්න මතු වේ. සේවය සඳහා ගාස්තුවක් අය කළ යුතුද ? පෞද්ගලික සංවිධාන සමග තරග කළ යුතුද ? මුදල් අයකර ඔවුන්ට තොරතුරු සැපයිය යුතුද ? යන කරුණු නිදසුන් වශයෙන් දැක්විය හැකිය.

මුළු ලොව පුරා ඇති පුස්තකාල අරමුදල් අඩු-කිරීමේ ප්‍රශ්නයට මුහුණ පා සිටියි. කාර්යක්ෂමතාව සඳහා ඔවුන්ගේ සියලුම කටයුතු පිරික්සා බැලිය යුතුයි. ජාතික පුස්තකාල ඔවුන්ගේ කාර්යයන් හා වියදම් පිළිබඳ රජයට උත්තර දිය යුතුය. එහෙයින් ඒවා කළමනාකරණය පිළිබඳ වඩාත් සැලකිලිමත් විය යුතු අතර සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ගත යුතු යි.

ජාතික පුස්තකාලවලට වරණයක් ඇත. ඒවා වෙනස් නොවී සකස් නොවුවහොත් මෙය ද නිසි පරිදි ඉටු නොකරනු ඇත. ඒවාට ක්‍රියාශීලි කාර්යයක් ඉටු කළ හැකිය. එසේ කළ හැකි වන්නේ ග්‍රන්ථ නාමාවලි සේවය, පුලේඛන සැපයීම හා තොරතුරු සේවය පිළිබඳවයි. මේ සියල්ලකින් ම මුදල් ඉපයිය හැකි අතර ජාතික පුස්තකාලය එ මගින් ව්‍යාප්ත වීමට හා වර්ධනය වීමට ඉවහල් වේ. එහි අභිප්‍රාය විය යුත්තේ පුරාලේඛනාගාරයක් හා සම්පතක් වශයෙන් සේවය කිරීමයි. ඇතැම්විට මේ කාර්යයන් දෙක අතර ගැටීමක් ද ඇති විය හැකි ය.

පුරාලේඛනාගාරයක් හා සම්පත් ආකරයක් වශයෙන් ජාතික පුස්තකාලයකට සම්පත් තදින්ම ඉල්ලා සිටිය හැකිය. එක් අතකින් ජාතික සංස්කෘතික උරුමය රැක්කිරීම හා සංරක්ෂණය ජාතික අභිමානයක් පමණක් නොව පාණ්ඩිත්‍යයට කරනු ලබන සේවයක්ද වේ අනික් අතින්, රටක ආර්ථික, සමාජයීය, විද්‍යාත්මක තාක්ෂණික හා අධ්‍යාපනික දියුණුව හා සංවර්ධනය බෙහෙවින්ම තොරතුරු මත රඳා පවතියි. බොහෝ තොරතුරු ප්‍රකාශනවල ඇතුළත් වෙයි.

ජාතික පුස්තකාලයක් සඳහා දනට ඇති ඉල්ලුම සීමා සහිත විය හැකිය. එහෙත් ඉල්ලුම සැපයීමේ කාර්යයක් වන බැවින් ද රැක්කිරීම් හා සේවා වැඩෙත්ම ඒවා ඉල්ලුම වැඩි කරයි. එවිට සම්පත් වැඩියෙන් ලබා ගැනීමට මෙම ඉල්ලුම යොදා ගත හැකිය. විශ්වාසයෙන් කටයුතු කිරීම අවශ්‍ය වන අතර අනාගතය ගැන ක්‍රියාශීලි ආකල්පයකින් බැලිය යුතුයි.

# පුස්තකාල සංවර්ධන සේවා

දිවයිනේ පිහිටුවා ඇති පුස්තකාල සංවර්ධනය කිරීමේ සැලැස්ම අනුව ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය වැඩ පිළිවෙළ ගණනාවක්ම ක්‍රියාත්මක කරගෙන එන අතර ඉන් එකක් වන පොත් පත් ආධාර දීමේ සේවාව යටතේ 1987 වර්ෂය තුළ පහත සඳහන් ප්‍රදානයන් කර ඇත.

| පුස්තකාල වර්ගය | සංඛ්‍යාව | පොත් ගණන | වටිනාකම |
|---|---|---|---|
| පාසල් පුස්තකාල | 57 | 8658 | 2,43,229. 75 |
| මහජන පුස්තකාල | 12 | 1600 | 40,457. 75 |
| වෙනත් පුස්තකාල | 41 | 5000 | 1,16,713. 25 |
| **එකතුව** | 110 | 15258 | 4,00,400. 75 |

# පුවත් ලුහුඬින්

## නේවාසික සම්මන්ත්‍රණයක්

පුස්තකාල අධ්‍යාපන අංශය මගින් සංවිධානය කරනු ලැබ පුස්තකාල විද්‍යා තැපැල් මාර්ගික පාඨමාලාව හදරන ශිෂ්‍යයින් සඳහා නේවාසික සම්මන්ත්‍රණයක් ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතන යේදී ජූලි මස 5 වැනි දින සිට 9 වැනි දින දක්වා පවත්වන ලදී. මේ පාඨමාලාවට 17 දෙනෙක් සහභාගි වූහ. ශිෂ්‍යයන් වෙත පාඩම් යැවීම හා පාඨමාලා පිළිබඳ අනෙකුත් කටයුතුද සිදු කරන ලදී.

## පාඨමාලා දෙකක් පැවැත්වේ.

මහජන පුස්තකාලයාධිපතින් සඳ-හා පාඨමාලාවක්ද පුස්තකාල සහකාර නිලධාරින් සඳහා පාඨමාලාවක්ද සැප්තැම්බර් 16 වෙනිදා සිට 19 දක්වා ඇඹිලිපිටියේ ග්‍රාමීය නායකයන් පුහුණු කිරීමේ මධ්‍යස්ථානයේදී පැවැත්විණි. පුස්තකාලයාධිපති පාඨමාලාවට පුස්තකාලයාධිපතිවරු 25 දෙනෙක්ද, සහකාර පාඨමාලාවට පුස්තකාල සහකාරවරු 23 දෙනෙක් ද සහභාගි වූහ.

## දින 4 ක වැඩ මුළුවක්

ජාතික අධ්‍යාපන ආයතනයේ පුස්තකාල සංවර්ධන ව්‍යාපෘතියේ වැඩ මුළුවක් ජාතික අධ්‍යාපන ආයතනයේ පුස්තකාලයාධිපතීන් හා ස්වේච්ඡා සේවකයන් 15 දෙනෙකු සඳහා ගොවි කටයුතු හා පුහුණු මධ්‍යස්ථානයේදී පැවැත්විණි. මෙහි පළමු වැනි කොටස ජූලි 27, 28 යන දෙදින තුළද දෙවැනි කොටස සැප්තැම්බර් 26, 27 යන දෙදින තුළද පවත්වන ලදී.

පොත් වෙළඳහල් පිළිබඳ නාමාවලියක්ද අධ්‍යාපන අංශය මගින් සම්පාදනය කර ගෙන යන අතර පුස්තකාල විද්‍යා ග්‍රන්ථ සිංහලට පරිවර්තනය කිරීමද දිගටම සිදු කර ගෙන යනු ලැබේ.

## විශ්ව විද්‍යාල සඳහා ඒකාබද්ධ පුස්තකාල සූචියක්

කොළඹ විශ්ව විද්‍යාලය, කැලණිය විශ්ව විද්‍යාලය, ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය, ජාතික ව්‍යාපාර කළමනාකරණ ආයතනය, මහනුවර මහජන පුස්තකාලය හා කොළඹ මහජන පුස්තකාලය සඳහා ඒකාබද්ධ සූචියක් සූචිකරණ අංශය මගින් දැන් සකස් කර ගෙන යනු ලැබේ. සූචිකරණ, වර්ගීකරණය හා ප්‍රතිග්‍රහණ කටයුතුවල ප්‍රගතියක්ද මේ කාල සීමාව තුළ දක්නට තිබිණි.

ජාතික ග්‍රන්ථ නාමාවලී අංශය මගින් කාඩ් සේවාව යටතේ, පේරාදෙනිය විශ්ව විද්‍යාලයට ග්‍රන්ථ නාමාවලී සූචිපත් සැපයීමද සිදු කරන ලදී.

## කතෘ ප්‍රකාශන ආධාර යටතේ

කතෘ ප්‍රකාශන ආධාර යටතේ ජූලි සිට සැප්තැම්බර් මස අග දක්වා ග්‍රන්ථ නාම විස්සකින් පිටපත් රාශියක් මිලදී ගෙන ඇත. එහි මුළු වටිනාකම රු. 19755 කි.

## සමාජ විද්‍යා පුස්තකාල තොරතුරු සංග්‍රහය

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ සමාජ ප්‍රලේඛන මධ්‍යස්ථානය මගින් සමාජ විද්‍යා පුස්තකාල පිළිබඳ තොරතුරු සංග්‍රහයක් නිකුත් කර ඇත. දිවයිනේ පිහිටි සමාජ විද්‍යා පුස්තකාල 89 යක ලිපිනයන්, දුරකතන අංක, පුස්තකාලයාධිපති ඇතුළු නිලධාරීන්, ඒ ඒ පුස්තකාල මගින් කැරෙන කාර්ය භාරයන් හා සේවාවන් පිළිබඳ දළ විස්තරයක් මෙයට ඇතුළත් වෙයි. මේ සංග්‍රහයෙහි පිටපත බැගින් සියලුම අදාල පුස්තකාලවලට නිකුත් කැර ඇත.

සමාජ විද්‍යාව පිළිබඳ සම්මන්ත්‍රණ අනුක්‍රමණිකාව "මූලික පද අනුක්‍රමිතා" ක්‍රමයට ගොනු කිරීම ද මෙම මධ්‍යස්ථානයෙන් සිදු කර ඇත.

ජාතික පුස්තකාල අධ්‍යක්ෂවරුන්ගේ 3 වැනි ජාත්‍යන්තර සම්මේලනයේ ක්‍රියා මාර්ග ඇතුළත් ග්‍රන්ථය මුද්‍රණය සඳහා බාර දී තිබේ.

## පොත් පිරුළු සේවාව හා රන්පර්ලි පොත් ආධාර

පුස්තකාල සේවා මණ්ඩලයේ පොත් පිරුළු සේවාව යටතේ දෙවැනි පාසැල් වාරය සඳහා පොත් කට්ටල නිකුත් කරන ලදී. කෝට්ටේ අධ්‍යාපන මණ්ඩලයේ පාසල් 11 කටද, මැද කොළඹ පාසල් 10 කටද, කොලොන්නාවේ පාසල් 13 කටද, ගම්පහ පාසල් 7 කටද මේ අනුව පොත් කට්ටල ලැබිණි. 1987 තෙවන පාසල් වාරය සඳහා පොත් තෝරා ගැනීම පිණිස පැමිණෙන ලෙස කළ දැන්වීම අනුව පාසල් කීපයක් දැනටම පිරුළු සේවාව වෙත පැමිණ ඇත.

මේ අතර පාසල් 20 කට රන්පර්ලි පොත් ආධාර බෙදා දෙන ලදී. මේ අනුව පොත් 1500 ක් පමණ පරිත්‍යාග කර ඇත.

# අපේ තොරතුරු

## ගොඩනැගිල්ල සෑද නිමවෙයි.

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල ගොඩනැගිල්ල ඉදිකිරීම් කටයුතු අවසන් කොට පසුගිය නොවැම්බර් මස මුලදී ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය වෙත රජයේ ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් භාර දෙන ලදී. රජයේ ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙනුවෙන් පුද්ගලික ඉදිකිරීම් සමාගමක් මගින් ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු කරන ලදී. ගොඩනැගිල්ලේ අභ්‍යන්තරය සැලසුම් කිරීම සහ අවශ්‍ය ගෘහ භාණ්ඩ සැලසුම් කිරීම දැනට පෞද්ගලික ගෘහ නිර්මාණ සමාගමක් විසින් ඉටු කරනු ලැබේ.

## රටවල් තුනක සංචාරයක්

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ සභාපති **එස්. අනුකෝරල** මහතා, අධ්‍යක්ෂ **එන්. අමරසිංහ** මහතා සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ පාසල් ගොඩනැගිලි ශාඛාවේ ප්‍රධාන ඉංජිනේරු **එම්. අබේසිංහ** මහතා පසුගියදා එක්සත් රාජධානිය, ප්‍රංසය සහ ඉතාලිය යන රටවල සංචාරයක යෙදුණාහ. ජාතික පුස්තකාල ගොඩනැගිල්ලේ **අභ්‍යන්තර සැලසුම් සහ ගෘහ භාණ්ඩ සැලසුම් පිළිබඳ අධ්‍යයනයක් කිරීම** මෙම චාරිකාවේ ප්‍රධාන අරමුණ විය. මෙම රට වල පුස්තකාල රාශියක් මෙහිදී අධ්‍යයනය කරන ලදී.

## ප්‍රතිපත්ති සකස් කරන කමිටුවක්

**ජාතික විද්‍යා හා තාක්ෂණ විඥාපන ප්‍රතිපත්තියක්** සකස් කරලීම සඳහා ස්වභාවික සම්පත් බලශක්ති හා විද්‍යා අධිකාරිය විසින් විශේෂ කමිටුවක් පත් කර ඇත. මෙම කමිටුවට ජාතික ලේඛනාගාර අධ්‍යක්ෂ ජී. පී. එච්. ද සිල්වා මහතා, ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ **එම්. එස්. යූ.** අමරසිරි මහතා, ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ මානෙල් අබේරත්න මහත්මිය, ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ ආචාර්ය දයානන්ද ද සිල්වා මහතා කෘෂිකර්ම සංවර්ධන හා පර්යේෂණ අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ ආචාර්ය ඩී. විජේවර්ධන මහතා සහ කාර්මික සංවර්ධන මණ්ඩලයේ විඥාපන සේවා අංශයේ අධ්‍යක්ෂ අයි. උණම්බුවේ මහත්මිය ඇතුළත් වෙති. ස්වාභාවික සම්පත් බලශක්ති හා විද්‍යා අධිකාරියේ විඥාපන සේවා අංශයේ අධ්‍යක්ෂ එන්. යූ. යාපා මහතා කමිටුවේ ලේකම් ලෙස කටයුතු කරයි.

## දෙවසරක පුහුණුව නිම කරයි

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ සහකාර අධ්‍යක්ෂිකා **නාලිනී ද සිල්වා** මෙනෙවිය ඉන්දියාවේ නව දිල්ලි නුවර විද්‍යා හා තාක්ෂණික ප්‍රලේඛන පුහුණු මධ්‍යස්ථානයේ දෙවසරක ශාස්ත්‍රපති පාඨමාලාවක් හදුරා පසුගියදා ආපසු පැමිණියේය.

## ප්‍රකාශනය පිළිබඳ පුහුණුවට යයි

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ ප්‍රකාශන නිලධාරි **නෙල්සන් පීරිස්** මහතා පොත් ප්‍රකාශනය පිළිබඳ පිලිපීන යේ මැනිලා නුවර පැවැත් වුණු සති 06 ක පුහුණු පාඨමාලාවකට නොවැම්බර් – දෙසැම්බර් මාස වල සහභාගි විය. මෙම පාඨමාලාව යුනෙස්කෝ ආයතනයේ අනුග්‍රහයෙන් පැවැත්විණි.

## සමීක්ෂණ ව්‍යාපෘතිය සාර්ථකයි

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය පසුගිය වසරේ ආරම්භ කළ **දිස්ත්‍රික් පුස්තකාල සමීක්ෂණ ව්‍යාපෘතියේ** කටයුතු සාර්ථක ලෙස නිම වෙමින් පවතී. දිස්ත්‍රික් 09 ක සමීක්ෂණ කටයුතු සම්පූර්ණයෙන් අවසන් වී ඇති අතර තවත් දිස්ත්‍රික් 10 ක සමීක්ෂණ කටයුතු දැනට ආරම්භ කර ඇත. මෙම සමීක්ෂණ වලින් ලබා ගන්නා ලද තොරතුරු අනුසාරයෙන් එක් එක් දිස්ත්‍රික්කය සඳහා විශේෂ පුස්තකාල තොරතුරු සංග්‍රහ නිකුත් කරලීමේ මූලික කටයුතු මණ්ඩලය විසින් අරඹා ඇත.

## පොත් වෙළඳහල් නාමාවලියක්

ලංකාවේ **පොත් වෙළෙඳ හල්** පිළිබඳ පුස්තකාල සේවා මණ්ඩලය කරන ලද **සමීක්ෂණයේ** කටයුතු අවසාන වී ඇත. මෙම තොරතුරු ඇසුරින් පොත් වෙළඳ හල් පිළිබඳ නාමාවලියක් ලඟදීම ප්‍රකාශයට පත් කිරීමට නියමිතය.

## පිරිවෙන් පුස්තකාල තොරතුරු

පුස්තකාල සේවා මණ්ඩලය විසින් කරන ලද **පිරිවෙන් පුස්තකාල සමීක්ෂණයේ** කටයුතුද සම්පූර්ණයෙන්ම අවසාන කර ඇත. ලංකාවේ පිරිවෙන් පුස්තකාල තොරතුරු සංග්‍රහය දැනට මුද්‍රණය වෙමින් පවතී.

## පොත් ප්‍රදර්ශන ගැන වාර්තාවක් සකස්වේ

**ජාතික ග්‍රන්ථ සංවර්ධන මණ්ඩලය** දිවයින පුරා පවත්වනු ලබන පොත් ප්‍රදර්ශන සහ සංදර්ශන කටයුතු ප්‍රතිසංවිධානය කරලීම සඳහා ඒ පිළිබඳ සොයාබලා වාර්තාවක් සැපයීමට ග්‍රන්ථ සංවර්ධන මණ්ඩලය විසින් කමිටුවක් පත්කොට ඇත. පුස්තකාල සේවා මණ්ඩලයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ එම්. එස්. යූ. අමරසිරි මහතා මෙම කමිටුවේ සභාපතිවරයා ලෙස කටයුතු කරයි.

## ප්‍රකාශන අයිතිය පිළිබඳ සම්මන්ත්‍රණයක්

**විශ්ව ප්‍රකාශන සුලභතා ව්‍යාපෘතිය** යටතේ **ප්‍රකාශන අයිතිය** පිළිබඳ දෙදින සම්මන්ත්‍රණයක් 1984 පෙබරවාරි මාසයේ අග භාගයේදී පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇත. මෙම සම්මන්ත්‍රණයට බ්‍රිතාන්‍යයේ ප්‍රකාශන අයිතිය පිළිබඳ කවුන්සලයේ සභාපති **ඩෙනිස් ඩිෆ්රෙයිටාස්** මහතා විශේෂ ආරාධිත අමුත්තකු ලෙස සහභාගි වේ.

## සම්මාන දිනූ ලේඛකයා මියයයි.

සුප්‍රසිද්ධ ලේඛකයෙකු සහ ග්‍රන්ථ පරිවර්තකයෙකු වන **ආරියදාස සෝමතිලක** මහතා පසුගියදා හදිසියේ අභාවප්‍රාප්ත විය. සෝමතිලක මහතා විසින් පරිවර්තනය කරන ලදුව පුස්තකාල සේවා මණ්ඩලයේ ග්‍රන්ථ සංවර්ධන ව්‍යාපෘතිය යටතේ පළ කරන ලද 'රන් දෙවොල බිඳ වැටේ' නවකථාවට 1986 වසරේ රාජ්‍ය සම්මාන හිමි විය.

# ග්‍රන්ථ සංවර්ධන ව්‍යාපෘතිය

# ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය

**ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ ග්‍රන්ථ සංවර්ධන ව්‍යාපෘතියේ අනුග්‍රහයෙන් පහත සඳහන් කෘතීන් 1987 ජූලි සිට දෙසැම්බර් දක්වා පළ කර ඇත.**

| විෂය | කර්තෘ නාමය | ග්‍රන්ථනාමය | මිල |
|---|---|---|---|
| සාමාන්‍ය | ආනන්ද විජයවීර | ඔබත් දක්ෂයකු වන්න | 18.00 |
| | ජයසිරි ලංකාගේ | ශාස්ත්‍රී උපාධි නිබන්ධන සම්පාදනයට උපදෙස් | 20.40 |
| දර්ශනය | ප්‍රදීපා පෙරේරා | සම්ප්‍රදායික සහ නවීන තර්ක ශාස්ත්‍රය | 30.00 |
| | රන්ජන් කුමාර් අන්ද්‍රාදි | මෝහනයේ හාස්කම් | 30.00 |
| | ආරියදාස සෝමතිලක | මනෝ විද්‍යාවේ හරය | 42.00 |
| නීතිය | ජයතිස්ස ද කොස්තා | නීති විද්‍යාව | 24.00 |
| අධ්‍යාපනය | මහාචාර්ය ඩී. අරම්පත්ත | ප්‍රජාව හා අධ්‍යාපනය | 21.60 |
| | ශ්‍රීමතී රාජපක්ෂ | කියවීම ඌනවර්ධනය හා ප්‍රතිකාර්ය අධ්‍යාපනය | 27.00 |
| සිරිත් විරිත් හා ජනශ්‍රැති | | | |
| | තලංගම ප්‍රේමදාස | රට රටවල සිරිත් විරිත් | 18.00 |
| භාෂාව සහ සාහිත්‍ය විචාර | | | |
| | නිමල් ජේ. ගමගේ | ගජමන් නෝනා | 21.60 |
| | පණ්ඩිත බැලුම්මහර පඤ්ඤාතිස්ස හිමි | සිංහල භාෂා සාහිත්‍යයේ විකාශනය | 36.00 |
| | සිරිපාල තිලකසේන | සිංහල හෝඩියේ පිළි හා අක්ෂර | 28.80 |
| | පා. දේ. සිරිපාල | ඉඟි වැකි පබඳ | 14.40 |
| නවකතා | ජනක මල්ලිමාරච්චි | මහපාරේ සිටුවරයෝ | 28.80 |
| | ලීලානන්ද වික්‍රමසිංහ | ගිරිකුළු වටලා ගඟක් ගැලුවයි | 30.00 |
| | වී. බී. ඉලංගරත්න | හිමි ගමනක් ගොසින් | 27.00 |
| | එච්. එම්. රත්නායක | හිම කැට | 21.00 |
| | කුමාර කරුණාරත්න | සුදු රෝස මල | 32.40 |
| | අනුලා ජයරත්න මැණිකේ | සුජාත පුත්‍රයින්ගේ වස්තුව | 39.00 |
| | ප්‍රාම් දෙල්දෙණිය | කඩු කස්තාන | 36.00 |
| | ස්වර්ණලතා කිරිවත්තුඩුව | ඉසුරු සොයා | 36.00 |
| | ප්‍රේමලාල් කවිකුමාර | පීඩිතයෝ | 27.00 |
| | Punyakanthi Wijenayaka | A Way of Life | 30.00 |
| | கே. எம். எம். செரீப் | காட்டில் எறித்த நிலா | 24.00 |
| කෙටිකතා | ජයනන්ද ධර්මසිරි | ලෝකය අයිති කරුවකු සමග පිළිසඳරක් | 26.40 |
| | බන්දුල ලියනගේ | පවට උපන් අය | 21.00 |
| | සමන් පුෂ්පා ගුණසේකර | අළුත් බලාපොරොත්තුවක් | 18.00 |
| | කිත්සිරි කාරියප්පෙරුම | බිම් බෝම්බය සහ හමුදා භටයා | 30.00 |
| | සරත් විජේසූරිය | විමුක්තිය | 24.00 |
| | සී. ඩී. ඒ. ඒකනායක | අසමානයෝ | 16.80 |
| | කේ. පී. නිහාල් නන්ද | දෙහිතක් එකතැන නතර වෙලා | 18.00 |
| | ඩබ්. එස්. සී. ප්‍රනාන්දු | එකම ලේ | 24.00 |
| | A. M. Hettiarachchi | Under the foot of a Giant Tusker and other Stories | 24.00 |

| | | | |
|---|---|---|---|
| **නාට්‍ය** | සමන් අතාවුදහෙට්ටි | රයිගම්පලගේ කයි කතන්දර | 18. 00 |
| | පත්මසිරි ප්‍රනාන්දු | අතුරු මිතුරු | 16. 80 |
| | ආරියරත්න විතාන | නැන්සිගේ බංගලාව සහ තවත් නාට්‍ය | 18. 00 |
| | එල්. ජී. හේවගේ | රුහුණේ වීරයා | 27. 00 |
| | ආනන්ද එස්. විජයසිරි | නෙත් අද බිසව් දෙව් ලොව යනකං | 27, 00 |
| **පද්‍ය** | අරිසෙන් අහුබුදු | අතු අගැ දිලි වන මල් | 30. 00 |
| | විපුලහේවා වලිමුනි / සුනන්ද රණසිංහ | පහන් දෙර | 14. 40 |
| **ළමා සහ යොවුන් සාහිත්‍යය** | | | |
| | පියසේන වික්‍රමගේ | ආශිර්වාද ලද වාසනා | 28. 80 |
| | සමන් කළුආරච්චි | අඳුරු දූපත | 14. 40 |
| | ආරියවංශ අබේසේකර | හිරුගේ දියණිය | 18. 00 |
| | අනුලා ද සිල්වා | අපි යාළුයි | 16. 80 |
| | සේපාල සමරතුංග | රජ දහන | 14. 40 |
| **පරිවර්තිත කෘති (නවකතා)** | | | |
| | දයා ගුණතිලක<br>**(GEORGE ELIOT)** | ගංතෙර<br>**(THE MILL ON THE FLOSS)** | 36. 00 |
| **පරිවර්තිත කෘති (පද්‍ය)** | | | |
| | සුචරිත ගම්ලත්<br>**(SRI KALIDASA)** | ඍතු සංහාරය<br>**(RITHU SANHARAYA)** | 21. 00 |
| **පරිවර්තිත කෘති (ළමා)** | | | |
| | සරත්චන්ද්‍ර වික්‍රමසූරිය | සින්ඩරැල්ලා සහ ලෝකප්‍රකට සුරංගනා කතා | 27. 00 |
| | සෝමපාල දෙමටපිටිය<br>**(YEN WEN-CHING)** | ඊළඟ සැරේ නැව් තොට<br>**(NEXT TIME PORT)** | 36. 00 |
| **විද්‍යාව** | ජී. ඩබ්. නන්දසේන<br>**(JAMES A. COLMAN)** | සාපේක්ෂතා වාදය<br>**(RELATIVITY FOR THE LAYMAN)** | 30. 00 |
| | ධනසිරි බෝධිනායක | ධූමකේතුවක් එයි | 18. 00 |
| | ලයනල් පී. හතුරුසිංහ | පරම්පරාවෙන් පරම්පරාවට පරිසරය | 30. 00 |
| | ගාමිණී කුමාර විතාන | ශ්‍රී ලංකාවේ සමුද්‍ර ක්ෂීරපායින් | 30. 00 |
| **සංගීත** | ආනන්ද ජයසිංහ | රාග ඥානය | 30. 00 |
| **චරිත කතා** | කේ. පියසේන | අපේ ආබාධිත මිතුරෝ | 24. 00 |
| | තිලකරත්න කුරුවිට බණ්ඩාර | රස දෝත | 36. 00 |
| | ගුණසේකර බණ්ඩාර | දුටු ගැමුණු කුමාරයා | 14. 40 |
| | එච්. එම්. මොරටුවගම | තෙරණියෝ | 24. 00 |

**ඉහත සඳහන් සියලුම කෘති විශේෂ වෙළඳ වට්ටම් යටතේ මහජන පුස්තකාල, පාසල් පුස්තකාල, දෙපාර්තමේන්තු පුස්තකාල හා සුභ සාධක පුස්තකාල සඳහා ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයෙන් මිලදී ගත හැකිය.**

# මහජන පුස්තකාල ව්‍යවස්ථා කමිටු නිර්දේශ

ශ්‍රී ලංකාවට සුදුසු පළාත් පාලන පුස්තකාල ව්‍යවස්ථා මාලාවක් නිර්දේශ කරලීම සඳහා පත් කරන ලද කමිටුවේ වාර්තාව පසුගිය සැප්තැම්බර් මාසයේදී මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදී. 1986 අප්‍රේල් මාසයේදී ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ සභාපති වරයා විසින් පත් කරන ලද මෙම කමිටුව 1987 අගෝස්තු මාසය තෙක් කමිටු රුස්වීම් ගණනාවක් පවත්වන ලදී. මේ පිළිබඳව වෘත්තීය පුස්තකාලයාධිපතීන්ගේ අදහස් විමසීම සඳහා සම්මන්ත්‍රණයක් ද පැවැත්විණි. අදාල යෝජනා ලිඛිතවද කමිටුව විසින් ලබා ගන්නා ලදී. දැනට සාර්ථක අන්දමට මහජන පුස්තකාල ව්‍යවස්ථාවක් ක්‍රියාත්මක වන ඉන්දියාව, මැලේසියාව, ඕස්ට්‍රේලියාව, තායිලන්තය, නිව්සීලන්තය, පැපුවා නිව්ගිනි, එක්සත් රාජධානිය, ඇමරිකා එක්සත් ජනපදය, කැනඩාව, නෝර්වේ, ඩෙන්මාර්ක්, නෙදර්ලන්තය ඇතුළු තවත් රටවල් ගණනාවක් මහජන පුස්තකාල ව්‍යවස්ථා කමිටුවේ පරීක්ෂණයට භාජනය විය.

මහජන පුස්තකාල ව්‍යවස්ථා කමිටුවේ වාර්තාවෙන් මහජන පුස්තකාල කටයුතු විධිමත් කරලීම සඳහා ස්ථර 04 කින් යුතු ආයතනික ව්‍යුහයක් නිර්දේශ කොට ඇත.

(අ) පළාත් පාලන අමාත්‍යාංශයේ පළාත් පාලන දෙපාර්තමේන්තුවට සම්බන්ධ මහජන පුස්තකාල ඒකකයක්.

(ආ) ඒ ඒ පරිපාලන දිස්ත්‍රික්කයට සම්බන්ධ කොට දිස්ත්‍රික් මධ්‍ය පුස්තකාල.

(ඇ) සියලුම වර්ගයේ පළාත් පාලන ආයතනවලට සම්බන්ධ කොට මහජන පුස්තකාල කමිටු.

(ඈ) සියලුම පළාත් පාලන ආයතන වලට සම්බන්ධ කොට මහජන පුස්තකාල සේවාවක්.

මෙම පුළුල් ආයතනික රටාව යටතේ ශක්තිමත් මහජන පුස්තකාල සේවාවක් පවත්වා ගැනීම සඳහා නිර්දේශ ගණනාවක් කමිටුව මගින් යෝජනා කර ඇත. මහජන පුස්තකාල ඒකකය මගින් මුළු දිවයිනෝම මහජන පුස්තකාල සේවාව මධ්‍යම රජය වෙනුවෙන් අධීක්ෂණය කරනු ලබයි. මේ තාක් කිසිදු දේශීය පළාත් පාලන ව්‍යවස්ථාවක මහජන පුස්තකාල සඳහාම කැපවුණු විශේෂ ආයතනයක් සංවිධානයක් හෝ වෙනම ව්‍යවස්ථාවක් නොමැති වූ අඩුපාඩුව මෙම යෝජනා විසින් සම්පූර්ණයෙන් ඉවත් කර ඇත. මහජන පුස්තකාල සඳහා මෙතෙක් කිසිදු අධීක්ෂණයක් නොවුණා මෙන් ම වාර්ෂික මුදල් වෙන් කිරීමක් නොවීමද විශාල දුබලතාවයක් විය. යෝජිත නිර්දේශ අනුව මේ තත්වය සම්පූර්ණයෙන්ම වෙනස් වේ. සෑම පළාත් පාලන ආයතනයක් මගින්ම අදල ප්‍රදේශයේ පළාත් සභාව සහ මධ්‍යම රජයේ මහජන පුස්තකාල ඒකකය මහජන පුස්තකාල කටයුතු සඳහා වාර්ෂිකව මුදල් ප්‍රමාණයක් වෙන් කළ යුතු වේ. මෙම මුදල් මහජන පුස්තකාල ඒකකය, අදල පළාත් පාලන ආයතනයේ පුස්තකාල ඒකකය, අදල පළාත් පාලන ආයතනයේ පුස්තකාල කමිටුව සහ ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය යන ආයතනවල අධීක්ෂණය යටතේ ක්‍රමානුකූල සැලැස්මක් සහිතව වැය කළ යුතු වේ.

මීට අමතරව මහජන පුස්තකාල සේවාව නව තාක්ෂණික ක්‍රම සහ නව විඥපන සේවාවක් උපයෝගි කර ගෙන උසස් මට්ටමකින් පවත්වා ගෙන යාමට අදල නිර්දේශ ගණනාවක් කමිටුව මගින් ඉදිරිපත් කර ඇත. ලංකාවේ ජනගහනයෙන් 70% ක් ග්‍රාමීය මට්ටමේ ජීවත් වන නිසා එම ජනතාවට සේවය කරන මහජන පුස්තකාල සේවාව ඉතා උසස් මට්ටමකින් පැවතිය යුතු බවට කමිටුව අවධාරණය කර ඇත.

මෙම කමිටු නිර්දේශ ක්‍රියාත්මක වුවහොත් එය මෙම සිය වසේ ලංකාවේ මහජන පුස්තකාල සේවාවේ විශාලතම ප්‍රතිසංවිධානය වනු ඇත.


## ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය

### පූර්ව කාලීන කලාප

ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලියේ 1974 වාර්ෂික වෙළුම දැන් නිකුත් වී ඇත.

### පිටපතක මිල රු. 80.00 කි.

**මුදල් ඇණවුම් හා චෙක්පත්, සභාපති "ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය" නමින් එවන්න.**

විමසීම්;-

සභාපති,
ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය,
නිදහස් මාවත,
කොළඹ - 07.

දුරකතන : 698847
95200

# පුස්තකාල ප්‍රවෘත්ති

## ත්‍රෛමාසික ප්‍රකාශනය

ආරම්භය : 1973

**සංස්කරණය හා ප්‍රකාශනය :**

පුස්තකාල පර්යේෂණ හා සංවර්ධන අංශය

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය

සැ. යු.

**මෙම ප්‍රකාශනයෙහි පළවන ලිපිවල සඳහන් අදහස් අනිවාර්යයෙන් ම ශ්‍රී ලංකා, ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ අදහස් නොවන අතර, ඒ පිළිබඳ වගකීම් අදාල ලේඛකයන් වෙත පැවරේ.**

| | |
|---|---|
| **කලාපයක මිල** | **රු: 5. 00** |
| **වාර්ෂික දායක මුදල** | **රු: 20. 00** |
| **(තැ. ගා. සමග)** | |

දායක මුදල්


ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය නමට ලියනු මැනවි.

විමසීම් හා ලිපි :

සභාපති

**ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය**

නිදහස් මාවත, කොළඹ 7. ටෙලි. 598847





ජාතික පුස්තකාල සතිය නිමිත්තෙන් පොත් ප්‍රදර්ශනයක් හා සම්මන්ත්‍රණයක් ඔක්තෝබර් මස 15 වැනිද ශ්‍රී ලංකා පදනම් ආයතනයේදී පවත්වන ලදී. පොල්මලක් පුබුදුවාලීමෙන් මේ ප්‍රදර්ශනය විවෘත කරන ලද්දේ අධ්‍යාපන සේවා අමාත්‍යාංශයේ ලේකම් එම්. ඩී. සී. සිල්වා මහතා විසිනි. ප්‍රදර්ශනය විවෘත කිරීමෙන් අනතුරුව සිල්වා මහතා එහි තිබුණු පොතක් ගෙන පෙරළා බලයි.


(පහළ ඡායාරූපය)



ඡායාරූපයේ දකුණු කෙළවරේ, අධ්‍යාපන සේවා ඇමතිතුමාගේ පෞද්ගලික ලේකම් හා මාණ්ඩලික සාමාජික ධර්මසේන රාස්සපාන මහතා ද දකුණු පසින් ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ උපාලි අමරසිරි මහතාද, පළාත් පාලන අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් සහ මාණ්ඩලික සාමාජික පැරකුම් විජේසිංහ මහතා ද වෙති.

ඇහැලියගොඩ පිටකන්ද විද්‍යාලයයේ නව බුද්ධිවාහිනී පුස්තකාලය විවෘත කිරීම පසුගිය ඔක්තෝබර් මස 21 වැනි දින සිදු විය. සුප්‍රසිද්ධ ලේඛකයෝ කිප දෙනෙක්ම පොල්තෙල් පහනක් දල්වා එය විවෘත කළහ. උත්සවය සංවිධානය කළ, එහි පුස්තකාලයාධිපති වශයෙන්ද කටයුතු කරන මාරාවිල අත්ථදස්සි හිමියෝද මෙහි සිටිති.





ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ ග්‍රන්ථ සංවර්ධන ව්‍යාපෘතිය යටතේ පළ කරන ලද නව ග්‍රන්ථ සම්භාරය අග්‍රාමාත්‍ය ආර්. ප්‍රේමදාස මහතා වෙත පිරිනමන ලද අවස්ථාවයි. ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ සභාපති සුගුණදාස අතුකෝරාළ මහතා පොත් මිටියක් අගමැතිතුමාට පිළිගන්වන අතර මණ්ඩලීය සාමාජික දයාවංශ ජයකොඩි මහතා ද පොත් මිටියක් පිළිගැන්වීමට සැරසී සිටී. අගමැතිතුමාගේ දකුණු පසින් සිනාමුසු මුහුණින් බලා සිටින්නේ අධ්‍යාපන සේවා ඇමති ලයනල් ජයතිලක මහතාය. ඇමතිතුමාගේ පෞද්ගලික ලේකම් ධර්මසේන රාස්සපාන මහතා ද ඒ අසලම සිටී.

අන්තර්ජාතික ප්‍රමිති ග්‍රන්ථ අංක ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ දෙවෙනි අදියර වශයෙන් රජයේ සහ රජයේ නොවන ආයතනික ප්‍රකාශකයන් සඳහා ඔක්තෝබර් 15 වැනි දින ශ්‍රී ලංකා පදනම් ආයතනයේදී සම්මන්ත්‍රණයක් පවත්වන ලදී. එහිදී ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ පුස්තකාලයාධිපතිනි (අන්තර් ජාතික ප්‍රමිති ග්‍රන්ථ අංක ව්‍යාපෘති) ජානකී ප්‍රනාන්දු මෙනෙවිය කරුණු පැහැදිලි කරයි. පින්තූරයේ වමේ සිට දකුණට පළාත්පාලන අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් පැරකුම් විජේසිංහ, අධ්‍යාපන සේවා අමාත්‍යාංශයේ ලේකම් එම්. බී. සී. සිල්වා, අධ්‍යාපන සේවා ඇමතිතුමාගේ පෞද්ගලික ලේකම් ධර්මසේන රාස්සපාන, ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ උපාලි අමරසිරි යන මහත්වරු වාඩිවී සිටිති.




ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය විසින් ගල්කිස්සේ ඩබ්ලිව්. ඩී. සී. (ප්‍රින්ටර්ස්) හි මුද්‍රණය කරවන ලදී.

## National Digitization Project

*National Science Foundation*

Institute : National Library and Documentation Services Board

1. Place of Scanning : National Library and Documentation Services Board, Colombo 07
2. Date Scanned : 2017/10/10
3. Name of Digitizing Company : Sanje (Private) Ltd, No 435/16, Kottawa Rd, Hokandara North, Arangala, Hokandara
4. Scanning Officer

Name : N.D.R. Gamage

Signature : ...................

Certification of Scanning

*I hereby certify that the scanning of this document was carried out under my supervision, according to the norms and standards of digital scanning accurately, also keeping with the originality of the original document to be accepted in a court of law.*

Certifying Officer

Designation : Library Documentation Officer

Name : Iromi Wijesundara

Signature : Irom

Date : 2017/10/10

*"This document/publication was digitized under National Digitization Project of the National Science Foundation, Sri Lanka"*